# සතිපට්ඨානය - Mindfulness

(විභංග, මහාසතිපට්ඨාන, ආනාපානසති සූත්‍ර)

**සතිපට්ඨානය**

බුදුරදුන් වෙත පැවිදි වූ ශ්‍රාවකයන්ගේ පිතෘවිෂය (පියාගේ වපසරිය) ලෙස දක්වා ඇත්තේ සතර සතිපට්ඨානයයි (*ගොචරෙ භික්ඛවෙ, චරථ සකෙ පෙත්තිකෙ විසයෙ*). තම ශ්‍රාවකයන්ට සතර සතිපට්ඨානය නමැති සිය පියාගේ විෂයයෙහි හැසිරෙන ලෙසත් එසේ හැසිරීමෙන් අනතුරකින් තොර ව ධර්මමාර්ගයෙහි ගමන් කළ හැකි බවත් බුදුරදුන්ගේ අනුශාසනයයි. විශේෂයෙන් අලුතින් පැවිදි ව සසුන්වන් නවක පැවිද්දන් මෙම සතර සතිපට්ඨානයෙහි හික්මවන ලෙස භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේට අනුශාසනා කළහ. සම්බුදු සසුන විෂයයෙහි ශ්‍රද්ධාවත් ශීලයත් ප්‍රඥාවත් වැඩදියුණු වීමට මෙම දහම් මග බෙහෙවින් උපකාරීවීම මීට හේතුවයි. තවද කිසියම් භික්ෂුවක් තමා තමාට ම ප්‍රදීපයක් (නොහොත් දිවයිනක්) සරණක් කොට වෙසේ නම් කළ යුත්තේ මෙම සතර සතිපට්ඨානය වැඩීම බව සඳහන් වේ. යමෙකුට සැබෑ රැකවරණයක් සැලසෙන්නේ සතිපට්ඨානය වැඩීමෙනි. සත්ත්වයාගේ ඇස, කන ආදි පංච ඉන්ද්‍රියයන්ට රැකවරණය සිතයි. හුදෙක් සිතක් තිබූ පමණින් එයට ආරක්ෂාවක් නොමැත. සිතට රැකවරණය ලෙස දක්වා ඇත්තේ සතිය හෙවත් සතිමත් බවයි. සිහියට රැකවරණයක් ලැබෙන්නේ කෙලෙසුන්ගෙන් සිත මුදවා ගැනීම නම් වූ විමුක්තිය තුළිනි. විමුක්තිය නිවන පිළිසරණ කොට පවතී. එමනිසා සතිපට්ඨානය වැඩීම රාග, ද්වේෂ, මෝහ දුරුකිරීම සඳහා වූ අසංඛත මාර්ගය ලෙස විස්තර වේ (සතිපට්ඨාන සුත්ත, සං.නි. සළායතන වග්ග).

නිවන් මග විවරණය කෙරෙන සූත්‍ර ධර්ම අතර මහාසතිපට්ඨාන සූත්‍රයට ප්‍රධාන තැනක් හිමි වේ. සම්පූර්ණ නිවන් මග සවිස්තරාත්මක ව එහි සඳහන් ව ඇත. බුදුදහමෙහි ප්‍රධාන ඉගැන්වීම් රැසකට මහාසතිපට්ඨාන සූත්‍රයේ ඇතුළත් කරුණු සම්බන්ධ ව පවතී. සංසාරගත සත්ත්වයා අනාදිමත් කාලයක් තිස්සේ අපමණ දුක් රැසක් විඳිමින් සසර සැරිසරන්නේ ලෝකය පිළිබඳ වැරදි ආකල්ප හතරක් නිසාවෙනි. මෙය 'සතර විපල්ලාස' නමින් හැඳින්වේ. ඒවා නම් :-

1. අසුභෙ සුභසඤ්ඤා (අසුභ දෑ සුභ වශයෙන් හඳුනා ගෙන සිටීම)
2. දුක්ඛෙ සුඛසඤ්ඤා (දුක් දෑ සැප වශයෙන් හඳුනා ගෙන සිටීම)
3. අනිච්චෙ නිච්චසඤ්ඤා (අනිත්‍ය දෑ නිත්‍ය වශයෙන් හඳුනා ගෙන සිටීම)
4. අනත්තෙ අත්තසඤ්ඤා (අනාත්ම දෑ ආත්ම වශයෙන් හඳුනා ගෙන සිටීම)

හුදෙක් යමක් අසුභ හෝ දුක් හෝ අනිත්‍ය හෝ අනාත්ම හෝ වූ පමණින් සත්ත්ව සන්තානයට දුක හට නොගනී. දුක හටගන්නේ අසුභ දේ සුභ ලෙසත් දුක් දේ සැප ලෙසත් අනිත්‍ය දේ නිත්‍ය ලෙසත් අනාත්ම දේ ආත්ම ලෙසත් වශයෙන් පවත්නා වැරදි චින්තනය නිසයි. මහාසතිපට්ඨාන සූත්‍රයෙහි සඳහන් සතර සතිපට්ඨානයෙන් ඉහත දැක්වූ සතර විපල්ලාස දුරුවීමට මග පෙන්වයි. කායානුපස්සනාවෙන් 'අසුභෙ සුභසඤ්ඤාව' ද වේදනානුපස්සනාවෙන් 'දුක්ඛෙ සුඛසඤ්ඤාව' ද චිත්තානුපස්සනාවෙන් 'අනිච්චෙ නිච්චසඤ්ඤාව' ද ධම්මානුපස්සනාවෙන් 'අනත්තෙ අත්තසඤ්ඤාව' ද දුරුවීමට අනුශාසනා කෙරේ. මෙලෙස සතර සතිපට්ඨානය වැඩීමෙන් සතර විපල්ලාස දුරුවන අතර, සතර ආහාරය පිරිසිඳ දැනීමට ද අවකාශ සැලසේ. කායානුපස්සනාව වැඩීමෙන් 'කබලිංකාර ආහාරය' පිරිසිඳ දැනීමටත් වේදනානුපස්සනාව වැඩීමෙන් 'ඵස්ස ආහාරය' පිරිසිඳ දැනීමටත් චිත්තානුපස්සාව වැඩීමෙන් 'විඤ්ඤාණ ආහාරය' පිරිසිඳ දැනීමටත් ධම්මානුපස්සනාව වැඩීමෙන් 'මනෝසඤ්චේතන ආහාරය' පිරිසිඳ දැනීමටත් හැකියාව ලැබේ.

භාග්‍යවතුන් වහන්සේ දුක පිළිබඳ විග්‍රහ කරමින් ජාති, ජරා, මරණාදි දුක් දක්වා ඒ සියල්ලට ම පදනම ලෙස දැක්වූයේ උපාදනස්කන්ධ පංචකයයි (*සංඛිත්තේන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා*). සතර සතිපට්ඨානය වැඩීම ස්කන්ධපංචකය පිරිසිඳ දැන ඊට ඇති ඇල්ම දුරුකර දුකින් නිදහස් වීමට හේතු වේ.

ඒ අනුව කායානුපස්සනාව වැඩීමෙන් රූපස්කන්ධය පිරිසිඳ දැනීමටත් වේදනානුපස්සනාව වැඩීමෙන් වේදනාස්කන්ධය පිරිසිඳ දැනීමටත් චිත්තානුපස්සනාව වැඩීමෙන් විඤ්ඤාණස්කන්ධය පිරිසිඳ දැනීමටත් ධම්මානුපස්සනාව වැඩීමෙන් සඤ්ඤා, සංඛාර යන ස්කන්ධ පිරිසිඳ දැනීමටත් අවකාශ සැලසේ. තවද සමස්ත බුද්ධවචනය නාමරූප පිරිසිඳ දැන ඒ කෙරෙහි පවත්නා ඇල්ම දුරුකිරීමට මග පෙන්වන දහමකි. කායානුපස්සනාවෙන් රූප ද සෙසු අනුපස්සනා තුනෙන් නාම ද පිරිසිඳ දැනීමට මග පෙන්වයි. මෙලෙස සතර සතිපට්ඨානය වැඩීම සම්මුති වශයෙන් සත්ත්වයා යනුවෙන් ව්‍යවහාර කෙරෙන සියල්ල වටහා ගැනීමටත් තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් ඒ පිළිබඳ ව පවත්නා සියලු ආශ්‍රව දුරු කිරීමටත් මාවත වේ. සතර සතිපට්ඨානය වැඩීම සමස්ත බුද්ධවචනය අනුගමනය කිරීමක් වන අතර එය සම්මා දිට්ඨිය පෙරටු කොටගත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා සතිය තුළින් ප්‍රකට වන්නකි.

කුරුරට කම්මාසදම්ම නම් කුරුවැසියන්ගේ නියම්ගමෙහි දී දේශනා කරන ලද මහාසතිපට්ඨාන සූත්‍රය (දී.නි. 2, 436 පිට) ආරම්භයෙහි දී ම බුදුරජාණන් වහන්සේ සතර සතිපට්ඨාන වැඩීමෙන් අත්වන ප්‍රතිඵල ලෝකය හමුවේ ඉදිරිපත් කරති. සතිපට්ඨානය වැඩීමේ ප්‍රතිඵල වශයෙන්,

සත්ත්වයන්ගේ පිරිසිදු බව සඳහා (*සත්තානං විසුද්ධියා*)

සෝක පරිදේවයන් ඉක්මවීම සඳහා (*සොකපරිද්දවානං සමතික්කමාය*)

දුක් දෙම්නස් නිමා කිරීම සඳහා (*දුක්ඛ දෙමනස්සානං අත්‍ථංගමාය*)

ඤාණය උපදවා ගැනීම සඳහා (*ඤායස්ස අධිගමාය*)

නිර්වාණය සාක්ෂාත් කිරීම සඳහා (*නිබ්බානස්ස සච්ඡිකිරියාය*)

ඒකායන ප්‍රතිපදව ලෙස දේශනා කොට ඇත්තේ සතර සතිපට්ඨානයයි

(*ඒකායනො අයං භික්ඛවේ මග්ගො ........... යදිදං චත්තාරො සතිපට්ඨානා*)

ලොව වෙසෙන ඕනෑම පුද්ගලයකුගේ උසස් අභිලාස කිහිපයක් මෙහි සඳහන් ව ඇත. මෙකී ප්‍රතිඵල සාක්ෂාත් කරගනු වස් ආරම්භයේදී ම තමා තුළ ඇති කර ගත යුතු ලක්ෂණ කිහිපයක් සූත්‍රයෙහි දැක්වේ. එනම් කෙලෙස් තවන වීර්යයෙන්, නුවණින් සිහියෙන් යුතු ව ලෝකය හෙවත් පඤ්චස්කන්ධය පිළිබඳ ව දැඩි ලෝභය හා දෙම්නස දුරු කොට (*'...ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්සං....'*) සතිපට්ඨානයෙහි යෙදිය යුතු බව බුදුරජාණන් වහන්සේ අනුශාසනා කරති. සිතෙහි දැඩි ලෝභය හා දෙම්නස භාවනාවට බාධාවකි. එබැවින් ලෝභය හැකිතාක් අවම කොට දෙම්නස් සිතිවිලිවලින් තොර ව ධර්මානුකූල ප්‍රීතියක් සහිත ව භාවනාවට සූදානම් වීම අවශ්‍ය කෙරේ. සතිපට්ඨානය වැඩීමට අපේක්ෂා කරන්නකු විසින් මෙම කරුණු පිළිබඳ ව මුල දී ම දැනුවත් ව එය අනුගමනය කළ යුතු ය.

තවද සතර සතිපට්ඨානය වැඩීමේ දී කුසල දහම්හි ආරම්භයේ දී පාරිශුද්ධත්වය ඇති කර ගත යුතු බව සඳහන් ව ඇත. මෙහි කුසල දහම්හි ආරම්භය වශයෙන් දක්වා ඇත්තේ සීලයෙන් පිරිසිදු බවට පත් ව දෘෂ්ටිය ඍජු කර ගැනීමයි. (... *ආදිමෙව විසොධෙහි කුසලෙසු ධම්මෙසු. කො ච ආදි කුසලානං ධම්මානං සීලං ච සුවිසුද්ධං, දිට්ඨි ච උජුකා.* භික්ඛු සුත්ත, සං.නි.5-1, සතිපට්ඨාන සංයුත්ත). ඒ අනුව පංචශීලය ආදි ශීලයක මැනැවින් පිහිටා ශාශ්වත, උච්ඡේද යන අන්තද්වයෙන් තොර ව දර්ශන සම්පත්තියෙන් යුතු ව සතර සතිපට්ඨානය භාවිත කළ යුතු ව ඇත.

'සති' යනු සිහියයි. 'පට්ඨාන' යනු නිවැරදි ලෙස පිහිටුවා ගැනීමයි. ඒ අනුව 'සතිපට්ඨාන' යනු අපගේ අවධානය හෙවත් සිහිය නිවැරදි ලෙස පිහිටුවා ගත යුතු ආකාරය පිළිබඳ විස්තර වන අනුශාසනයයි. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත නිවී සැනැහෙන මාවතෙහි වැඩිය යුතු ගුණාංග අතර සතිපට්ඨානයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. සතිසම්පජඤ්ඤ, සතර සතිපට්ඨාන, සති ඉන්ද්‍රිය, සති බල, සති සම්බොජ්ඣංග, සම්මා සති ආදි මූලික ඉගැන්වීම් රැසක ප්‍රධාන කරුණක් ලෙස සතිය විස්තර

කොට ඇත්තේ එබැවිනි. අප කෙතෙක් දුර කෙලෙස් දුරලමින් මානසික සුවය ලබා ගැනීමෙහි නිරත වී සිටිනවා ද යන්න තීරණය කෙරෙන ප්‍රධාන සාධකයක් වන්නේ සතිපට්ඨානය කෙතෙක් දුරට වඩනවා ද යන කරුණයි. එබැවින් විශේෂයෙන් අප කිසියම් ආකාරයක මානසික දෙම්නසක්, අසහනයක් අත්විඳිනවා නම් ඊට ප්‍රධානතම හේතුව සත්ත්වයා නිර්මාණය වූ ආකාරය පිළිබඳ සැබෑ තතු නොදැනීම් අවිද්‍යාවයි හෙවත් මෝහයයි. එනම් සත්ත්වයා හා ලෝකය පිළිබඳව දුක ඇතිවන හා නිරුද්ධ වන ආකාරය පිළිබඳ අනවබෝධයයි. සතර සතිපට්ඨානයෙන් අපට මග පෙන්වන්නේ සත්ත්වයා නිර්මාණය වූ ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දී ඊට ඇති ආශාව, බැඳීම නිරුද්ධ වන ආකාරයට සිහි පිහිටුවා ගැනීමට නුවණ ලබාදීමයි. එහි දී සත්ත්වයා හෝ පුද්ගලයා නමින් අප ව්‍යවහාර කරන සිත-කය, නාමරූප - විඤ්ඤාණ, පංචඋපාදනස්කන්ධය, දෙළොස් ආයතන, අටලොස් ධාතු පිළිබඳ පැහැදිලි අවබෝධයක් අප වෙත ලබා දේ. එම අවබෝධය හෙවත් විද්‍යාව ලබා ගත් පමණට ලෝකය හෙවත් සත්ත්වයා පිළිබඳ අවබෝධය වර්ධනය වී දුකින් නිදහස් වීමට අවකාශ සැලසේ. බුදුදහමේ එන සියලු ඉගැන්වීම් මෙම සතර සතිපට්ඨානය තුළට අන්තර්ගත කිරීමේ හැකියාව පවතී.

සත්ත්වයාගේ සමස්ත අත්දැකීම් පිළිබඳව ම සිහිය පිහිටුවා ගත යුතු ස්ථාන සතරක් මහාසතිපට්ඨාන සූත්‍රයෙහි සඳහන් ව ඇත. ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රිය ඔස්සේ ලබන ආධ්‍යාත්මික හා බාහිර ලෝකය පිළිබඳ සියලු අත්දැකීම් මීට ඇතුළත් වේ. එනම් :-

1. කයෙහි කය අනුව නුවණින් බලන කායානුපස්සනාව
2. වේදනාවන්හි වේදනා අනුව නුවණින් බලන වේදනානුපස්සනාව
3. සිතෙහි සිත අනුව නුවණින් බලන චිත්තානුපස්සනාව
4. ධර්මයන්හි ධර්මයන් අනුව නුවණින් බලන ධම්මානුපස්සනාව

යන අනුපස්සනා සතරයි.

සතර සතිපට්ඨානය වැඩීමේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රාවකයා තුළ සිහිය හා නුවණ යන අංග දෙක ම දියුණු විය යුතුය. සිහිය යනු සතියයි. නුවණ යනු සම්පජඤ්ඤය හෙවත් ප්‍රඥාවයි. සතිය යනු යමෙකු එක් අතකින් ගොයම් මිටක් අල්ලා ගැනීම හා සමානයි. එම අනෙක් අතින් දැකැත්තෙන් එම ගොයම් මිට කැපීම සම්පජඤ්ඤය හෙවත් ප්‍රඥාවයි. බුදුදහමින් අපේක්ෂිත සැබෑ භාවනාව සඵල වන්නේ මෙම අංග දෙක ම මැනැවින් සම්පූර්ණ වීම් වශයෙනි. ඒ අනුව කය, වේදනා, චිත්ත, ධම්ම යන ස්ථානයන්හි සිහිය පිහිටුවා ගැනීම සතිපට්ඨානයයි. එනම් චිත්ත භාවනාව හෙවත් සමථ භාවනාවයි. එලෙස සිහිය මැනැවින් පිහිටි පසු එම කායාදියෙහි හටගැනීම හා නිරෝධය දැකීම සතිපට්ඨාන භාවනාවයි. එනම් පඤ්ඤා භාවනා හෙවත් විපස්සනා භාවනාවයි.

සූත්‍ර පිටකයේ දීඝ නිකායේ මහාසතිපට්ඨාන සූත්‍රයට අමතරව මජ්ඣිම නිකායේ සතිපට්ඨාන සූත්‍රයෙහි ද සංයුත්ත නිකායෙහි සතිපට්ඨාන සංයුත්තයෙහි ද අංගුත්තර නිකායෙහි සතිපට්ඨාන වග්ගයෙහි ද පටිසම්භිදමග්ගයෙහි සතිපට්ඨාන කථාවෙහි ද අභිධර්ම පිටකයෙහි විභංගප්පකරණයෙහි සතිපට්ඨාන විභංගයෙහි ද සතිපට්ඨානය වැඩිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් ඇතුළත්ව ඇත. ඊට අමතරව විසුද්ධිමග්ගයෙහි හා අභිධම්මත්ථසංගහයෙහි ද මේ පිළිබඳ විස්තර වේ. භාග්‍යවතුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට ධර්ම දේශනා කිරීමේ දී සතිපට්ඨානයෙහි වැදගත්කම නිතර අවධාරණය කර තිබෙනු දක්නට ලැබේ. තථාගත දේශිත සෑම දහම් පදයක ම සතිපට්ඨානය හා සබැඳියාවක් පවතී. ප්‍රාණඝාතාදී පංචවිධ ශික්ෂා දුර්වලත්වය ප්‍රහීණ කරලනු සඳහා ද චක්ඛුවිඤ්ඤෙයයාදි පංචකාමගුණයන්ගේ ප්‍රහාණය සඳහා ද කාමච්ඡන්දදි පංචනීවරණ ප්‍රහාණය සඳහා ද රූපූපාදනස්කන්ධ ආදි පංච උපාදනස්කන්ධයන්ගේ ප්‍රහාණය සඳහා ද නිරය ආදි පංචවිධ ගතීන්ගේ ප්‍රහාණය සඳහා ද රූපරාග ආදි උද්ධම්භාගීය සංයෝජන ප්‍රහාණය සඳහා ද සතර සතිපට්ඨානය වඩන ලෙස බුදුරජාණන් වහන්සේ අනුශාසනා කරති.

ජාතිය හෙවත් ඉපදීම ක්ෂය කොට නිවන් සාක්ෂාත් කිරීමේ මාවත දක්නා වූ ලොවට හිතවැඩ කැමැති භාග්‍යවතුන් වහන්සේ ඒ සඳහා ඒකායන මාවත වශයෙන් දේශනා කළේ සතර සතිපට්ඨානයයි. යමෙක් අතීතයෙහි කාමාදි චතුරෝඝය තරණය කළේ ද දැන් තරණය කරයි ද මතු තරණය කරන්නේ ද ඒ සැවොම මෙම සතිපට්ඨාන මාවතින් ම එය කළාහු ය.

*'ඒකායනං ජාතික්ඛයන්තදස්සී මග්ගං පජානාති හිතානුකම්පී,*
*එතෙන මග්ගෙන අතරිංසු පුබ්බෙ තරිස්සන්ති යෙ ච තරන්ති ඔඝන්ති.'*

## සතිපට්ඨානය - සතිපට්ඨානභාවනාව - සතිපට්ඨානභාවනාගාමිනීපටිපද

සංයුත්ත නිකායේ සතිපට්ඨාන සංයුත්තයේ **විභාග සූත්‍රයට** අනුව සතිපට්ඨාන භාවනාවට සම්බන්ධ කරුණු තුනක් පැහැදිලි කර තිබේ. ඒ අනුව සතිපට්ඨානය, සතිපට්ඨානභාවනාව, සතිපට්ඨානගාමිනීපටිපදාව යනු ඒ කරුණු තුනයි. එහි **'සතිපට්ඨාන' යනුවෙන් දක්වෙන්නේ කායානුපස්සනා වේදනානුපස්සනා චිත්තානුපස්සනා හා ධම්මානුපස්සනා යන හතරයි. එනම් කය, වේදනා, සිත, ධම්ම යන ස්ථාන සතරෙහි සිහිය පිහිටුවා ගැනීමයි. 'සතිපට්ඨාන භාවනාව' යනු කාය, වේදනා, චිත්ත, ධම්ම යන සතරෙහි හටගැනීම (*සමුදයධම්මානුපස්සී විහරති*) හා නිරුද්ධවීම (*වයධම්මානුපස්සී විහරති*) අනිත්‍ය සිද්ධාන්තයට අනුව මෙනෙහි කිරීමයි. සම්මාදිට්ඨිය පෙරටු කොටගත් ආර්යඅෂ්ටාංගික මාර්ගය දක්වා ඇත්තේ 'සතිපට්ඨානභාවනාගාමිනී පටිපදාව' වශයෙනි.** ඉහත දැක්වූ අංග තුන ම නිවන සඳහා සතර සතිපට්ඨානය වඩන්නා තුළ තිබිය යුතු ලක්ෂණයන් ය.

ස්වාභාවිකව සිදුවන හුස්ම ඇතුළුවීම හා පිටවීම පිළිබඳ වූ ශරීරික ක්‍රියාවලියට තම සිහිය හා නුවණ එක්කිරීම් වශයෙන් සිදු කරන භාවනාව 'ආනාපානසතිය' නමින් හැඳින්වේ. බුදුදහමෙහි දැක්වෙන සමසතලිස් (40ක් පමණ) කමටහන් අතර ආනාපානසති භාවනාවට ප්‍රධාන ස්ථානයක් හිමි වේ. ලොව පහළවන සියලු බුදුරජාණන් වහන්සේලාත් බොහෝ රහතන් වහන්සේලාත් නිර්වාණාවබෝධය සඳහා භාවිත කරන ප්‍රධාන කමටහනක් වීම ඊට හේතුවයි. උපතින් ලැබෙන දයාදයක් වන ආශ්වාස-ප්‍රශ්වාස ක්‍රියාවලියට සිහිය යෙදවීමෙන් සිත සමාධිමත් කර ගැනීමටත් එමගින් තම සිතෙහි උපරිම සතුට වර්ධනය කර ගැනීමටත් එකඟ වූ සිතින් අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රිලක්ෂණ මෙනෙහි කිරීම් වශයෙන් විදර්ශනා නුවණ දියුණු කොට සසර දුකින් සපුරා නිදහස්වීමටත් මෙම එක ම ආනාපානසති භාවනාව මහෝපකාරී වන අයුරු පෙළ දහමෙහි නොයෙක් තැන විස්තර වේ. ආනාපානසති (ම.නි.3) සූත්‍රය, ගිරිමානන්ද සූත්‍රය (අං.නි.), මහාසතිපට්ඨාන සූත්‍රය (දී.නි.) ආදි තැන්හි මේ පිළිබඳව තොරතුරු සඳහන් වේ.

ආනාපානසතිය වඩන අයුරු ඇතැම් තැනෙක සංක්ෂිප්තව ද තවත් තැනෙක සවිස්තරාත්මකව ද පැහැදිලි කර තිබෙනු දක්නට ලැබේ. මහාසතිපට්ඨාන සූත්‍රයෙහි කායානුපස්සනාවට අදාළ ආනාපානසති භාවනාවේ මූලික කොටස් හතර පමණක් දැක්වෙන අතර ආනාපානසති සූත්‍රය හා ගිරිමානන්ද සූත්‍රය වැනි තැන්හි සතර සතිපට්ඨානය ම වැඩෙන අයුරින් එහි පියවර 16ක් දක්වා තිබේ.

භාග්‍යවතුන් වහන්සේ ආනාපානසති සූත්‍රයෙහි දක්වා ඇති පරිදි ආනාපානසතිය වඩන භික්ෂූන් වෙසෙන අතර ආනාපානසතිය බහුලව වැඩීමෙන් මහත්ඵල මහානිසංස සැලසෙන බව සඳහන් වේ. තවදුරටත් ඒ පිළිබඳව විස්තර කරන බුදුරජාණන් වහන්සේ මැනැවින් **ආනාපානසතිය භාවිත කිරීමෙන් සතර සතිපට්ඨානය වැඩෙන බවත් සතර සතිපට්ඨානය සම්පූර්ණ වීමෙන් සත්ත බොජ්ඣංග සම්පූර්ණ වන බවත් සත්ත බොජ්ඣංග සම්පූර්ණ වීමෙන් විද්‍යා - විමුක්ති සාක්ෂාත් වන බවත් දක්වා තිබේ.** ඉන්පසුව ආනාපානසතිය වඩන අයුරු අනුපිළිවෙළින් පැහැදිලි කොට තිබේ.

*කතමා චානන්ද, ආනාපානසති? ඉධානන්ද, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො සතොව අස්සසති සතොව පස්සසති.*

ආරණ්‍යකට හෝ රුක්මුලකට හෝ හිස් පෙදෙසකට ගිය ශ්‍රාවකයා පලගක් බැඳ තම කය ඍජුව තබාගෙන සිහිය අබිමුව කොට සිහියෙන් හුස්ම ගනියි. සිහියෙන් හුස්ම පිටකරයි. මෙලෙස සෑහෙන කාලයක් නුවණින් හුස්ම ගැනීම හා පිටකිරීමෙහි ප්‍රතිඵල වශයෙන් ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳ වැටහීම කෙමෙන් දියුණුවට පත් වේ. ඒ අනුව

1. දීර්ඝව හුස්ම ගැනීමේ (ආශ්වාසයේ) දී දීර්ඝව හුස්ම ගන්නා බව නුවණින් දකියි.
   (*දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමී'ති පජානාති.*)
   දීර්ඝව හුස්ම පිටකිරීමේ (ප්‍රශ්වාසයේ) දී දීර්ඝව හුස්ම පිටකරන බව නුවණින් දකියි.
   (*දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමී'ති පජානාති*)
2. කෙටිව (හ්‍රස්ව ව) හුස්ම ගන්නා විට කෙටි වශයෙන් හුස්ම ගන්නා බව නුවණින් දකියි.
   (*රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමී'ති පජානාති*)
   කෙටිව හුස්ම පිටකරන විට කෙටිව හුස්ම පිටකරන බව නුවණින් දකියි.
   (*රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමී'ති පජානාති*)
3. තවද හුස්ම (ආශ්වාස-ප්‍රශ්වාස) කය පිළිබඳව සම්පූර්ණ අවබෝධයෙන් යුතුව ආශ්වාස කරමි'යි හික්මෙයි.
   (*සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති*)
   හුස්ම කය පිළිබඳව සම්පූර්ණ අවබෝධයෙන් යුතුව ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
   (*සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.*)
4. තවද ආශ්වාස-ප්‍රශ්වාසය නම් වූ හුස්ම කය (කායසංඛාරය) සංසිඳවීම පිළිබඳ අවබෝධයෙන් ආශ්වාස කරමි'යි හික්මෙයි. (*පස්සම්භයං කායසඞ්කාරං අස්සසිස්සාමී'ති සික්ඛති.*)
   හුස්ම කය (කායසංඛාරය) සංසිඳවීම පිළිබඳ අවබෝධයෙන් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
   (*පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති*).

ඉහත සඳහන් පියවර හතරෙන් විස්තර වන්නේ සතර සතිපට්ඨානයෙහි කායානුපස්සනාව සම්පූර්ණ වන ආකාරයයි. බුදුදහමෙහි සඳහන් නිවන්මග පිළිබඳ ශ්‍රැතමය ඥානය සහිතව ආනාපානසතිය වඩන ශ්‍රවකයා තුළ තම කය අරභයා ක්‍රමයෙන් සිත සමාධිමත් වන අයුරු මෙමගින් විස්තර වේ. විශේෂයෙන් ආශ්වාස ප්‍රශ්වාස (කාය සංඛාර) නම් වූ හුස්ම කය පිළිබඳ අවබෝධය ක්‍රමයෙන් දියුණු වේ. ඒ අනුව රූපය නිර්මාණය වීමට බලපෑ සතර මහාභූත රූප හා ඊට අදළ උපාදය රූප පිළිබඳ වැටහීම දියුණු වේ. මෙහි දී සිදුවන්නේ රූපස්කන්ධය ප්‍රකට වීමයි. වෙනත් අයුරකින් සඳහන් කළහොත් රූපය නිර්මාණය වීමට හේතු වූ කබලිංකාර ආහාරය වැටහී යාමයි. අසුභයෙහි සුභ විපල්ලාසය දුරුවීම ද මෙමගින් සිදුවේ.

කය පිළිබඳ අවබෝධය දියුණු කරමින් තවදුරටත් ආනාපානසතියෙහි යෙදෙන ශ්‍රාවකයා තුළ වේදනාව පිළිබඳ අවබෝධය ප්‍රකට වේ.

5. මානසික ප්‍රීතිය-සතුට දැන ගනිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
   (*පීතිපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති.*)
   මානසික ප්‍රීතිය-සතුට දැන ගනිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
   (*පීතිපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.*)
6. කායික සුවය දැන ගනිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
   (*සුඛපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති.*)
   කායික සුවය දැන ගනිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
   (*සුඛපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.*)
7. චිත්තසංඛාර හෙවත් සඤ්ඤ-වේදනා දැන ගනිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
   (*චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති.*)
   චිත්තසංඛාර (සඤ්ඤ-වේදනා) දැන ගනිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
   (*චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.*)

8. චිත්තසංඛාර (සඤ්ඤා-වේදනා) සංසිඳීම දැන ගනිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
(*පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති.*)
චිත්තසංඛාර (සඤ්ඤා-වේදනා) සංසිඳීම දැන ගනිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
(*පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති.*)

මෙම පියවර හතරින් විස්තර වන්නේ ඇස්, කන් නාසාදි ඉන්ද්‍රිය හය ඔස්සේ ලැබෙන වේදනා, සඤ්ඤා පිළිබඳ අවබෝධය සහිත සතිමත් බව දියුණුකිරීමයි. මෙලෙස මනා දැනුමෙන් යුතුව ආනාපානසතිය වැඩමේ දී  ක්‍රමයෙන් සඤ්ඤා, වේදනා ස්කන්ධ පිළිබඳ සිහිය හා නුවණ දියුණුවට පත් වෙමින් සතිමත් බව වඩ වඩාත් ශක්තිමත් වේ. මෙහි දී වේදනාස්කන්ධය ප්‍රකට වන අතර ස්පර්ශ ආහාරය පිළිබඳ අවබෝධය ද දියුණු වේ. ඉහත පියවර සාර්ථක වීමෙන් ප්‍රීතිය හා සැපය දියුණු වීම නිසා බලවත් සතුටින් තවදුරටත් ආනාපානසතිය වැඩීමේදී වඩ වඩාත් ආනාපානසතිය තුළ සිහිය ශක්තිමත් වේ.

ඊළඟට සිත හෙවත් විඤ්ඤාණස්කන්ධය පිළිබඳ අවබෝධය දියුණු වේ. ඒ අනුව,

9. සිත පිළිබඳ මනා සිහියෙන් ආශ්වාස කරමි'යි හික්මෙයි.
(*චිත්තපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති.*)
සිත පිළිබඳ මනා සිහියෙන් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
(*චිත්තපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.*)

10. සිතෙහි දැඩි සතුටින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
(*අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති.*)
සිතෙහි දැඩි සතුටින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
(*අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති.*)

11. සමාධිමත් සිතින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
(*සමාදහං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති.*)
සමාධිමත් සිතින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
(*සමාදහං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති.*)

12. සිත කෙලෙසුන්ගෙන් මුදවාලමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
(*විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති.*)
සිත කෙලෙසුන්ගෙන් මුදවාලමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
(*විමොචයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති.*)

ඉහත පියවර හතර සම්පූර්ණ වීමේ දී විඤ්ඤාණය හා එහි හටගැනීම් වැයවීම් පිළිබඳ අවබෝධය ප්‍රකට වේ. ඒ අතර විඤ්ඤාණාහාරය පිළිබඳ අවබෝධය ද දියුණු වේ. ආර්ය න්‍යාය හෙවත් පටිච්චසමුප්පාදය පිළිබඳ අවබෝධයෙන් යුතුව සිත සමාධිමත් වීමේ අවසාන ප්‍රතිඵලය නම් ඇත්ත ඇති සැටියෙන් දැකීමේ නුවණ ලැබීමයි. මෙලෙස ආනාපානසතියෙහි සිත භාවිත කිරීමෙන් ලැබෙන බලවත් ආධ්‍යාත්මික සතුට හා සමාධිමත් බව නිසා ලෝක යථාර්ථය නම් වූ ත්‍රිලක්ෂණය දැකීමට සිත නැඹුරු වේ.

13. අනිත්‍යතාව දකිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
(*අනිච්චානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති.*)
අනිත්‍යතාව දකිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
(*අනිච්චානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.*)

14. විරාගීබව දකිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
(*විරාගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති.*)
විරාගීබව දකිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
(*විරාගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.*)

15. දුකින් නිදහස්වීම දකිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
(*නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති.*)
දුකින් නිදහස්වීම දකිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
(*නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.*)
16. නිවන්සුවය අත්විඳිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.
(*පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති.*)
නිවන්සුවය අත්විඳිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.
(*පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.*)

ඉහත පියවර හතර සම්පූර්ණ වීමේ දී ධම්මානුපස්සනාව වැඩෙන අතර සංඛාරස්කන්ධය ප්‍රකට වේ. එමෙන් ම මනෝසංචේතනාහාරය අවබෝධයට පත්වන මේ සමගින් දුකින් නිදහස්වීමේ ඒකායන මාවත වශයෙන් බුදුරදුන් වදාළ සතර සතිපට්ඨානය ම සම්පූර්ණත්වයට පත් වේ.

ආනාපානසති භාවනාව වැඩීමේ දී ඛුද්දක නිකායෙහි පටිසම්භිදමග්ග නමැති ග්‍රන්ථයෙහි ආනාපානසති කථා කොටසෙහි එන ආනාපානසති භාවනාව සම්බන්ධව ඇති කර ගත ඥාන පිළිබඳ විස්තරය බෙහෙවින් වැදගත් වේ. එහි දැක්වෙන පරිදි ආනාපානසතියට උපක්ලේශ (බාධක) වශයෙන් පැමිණෙන කරුණු 18 පිළිබඳව දැන සිටීම ආනාපානසති භාවනාව වැඩීමේ දී නොමග යාම්වලින් මිදීමට හේතුවේ. ඒ අනුව ආනාපානසතිය වැඩීමේ දී අනුගමනය නොකළ යුතු කරුණු 18 නම්,

1. ආශ්වාසයේ (හුස්ම ගැනීමේදී) මුල-මැද-අග වශයෙන් සිහිකරන්නහුගේ ආධ්‍යාත්ම වශයෙන් වික්ෂිප්ත භාවයට ගිය සිත සමාධියට බාධාවකි (උවදුරකි).

2. ප්‍රශ්වාසයේ (හුස්ම පිටකිරීමේදී) මුල-මැද-අග වශයෙන් සිහිකරන්නහුගේ බාහිර වශයෙන් වික්ෂිප්ත භාවයට ගිය සිත සමාධියට බාධාවකි.

3. ආශ්වාසය පිළිබඳ ප්‍රාර්ථනාවෙන් යුතු නිකාමය වූ (තම කැමැත්තෙන් යුතු) තෘෂ්ණාවේ පැවැත්ම සමාධියට බාධාවකි.

4. ප්‍රශ්වාසය පිළිබඳ ප්‍රාර්ථනාවෙන් යුතු නිකාමය වූ තෘෂ්ණාවේ පැවැත්ම සමාධියට බාධාවකි.

5. ආශ්වාස කරන විට ප්‍රශ්වාසය ලැබීමෙහි ඇලීම සමාධියට බාධාවකි.

6. ප්‍රශ්වාස කරන විට ආශ්වාසය ලැබීමෙහි ඇලීම ද සමාධියට බාධාවකි.

7. (ආශ්වාස) නිමිත්ත ආවර්ජනා කරන්නාට ආශ්වාසයෙහි සිත සැලෙයි. එය සමාධියට බාධාවකි.

8. ආශ්වාසය ආවර්ජනා කරන්නාට නිමිත්තෙහි සිත සැලෙයි, එය ද සමාධියට බාධාවකි.

9. (ප්‍රශ්වාස) නිමිත්ත ආවර්ජනා කරන්නාට ප්‍රශ්වාසයෙහි සිත සැලෙයි, එය ද සමාධියට බාධාවකි.

10. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නාට නිමිත්තෙහි සිත සැලෙයි, එය ද සමාධියට බාධාවකි.

11. ආශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි විසිරෙයි.

12. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත ආශ්වාසයෙහි සැලෙයි, විසිරෙයි.

13. අතීත ආශ්වාස-ප්‍රශ්වාස අනුව ගිය සිත වික්ෂිප්ත වන හෙයින් එය සමාධියට උවදුරෙකි, බාධාවකි.

14. අනාගත ආශ්වාස-ප්‍රශ්වාසය පතන සිත සැලුණේ සමාධියට බාධාවකි.

15. ලීන (සැඟවුණ=හැකිලුණ) වූ සිත කුසීතබව අනුව ගියේ සමාධියට බාධාවකි.

16. ඉතා දැඩිව ගන්නා ලද සිත උද්ධච්චයට (නොසන්සුන්බවට) වැටුණේ සමාධියට බාධාවකි.

17. වෙසෙසින් නැමුණු සිත රාගය අනුව ගියේ සමාධියට බාධාවකි.

18. නොනැමුණු (නතු නොවූ) සිත ව්‍යාපාදය අනුව ගියේ සමාධියට බාධාවකි. (පටි.ම.1, )

ඉහත සඳහන් කරුණු 18 තේරුම් ගෙන එම තත්ත්වයන්ට තම සිත නොවැටෙන පරිදි ආනාපානසතිය තුළ සිහිය හා නුවණ භාවිත කිරීම මෙම භාවනාවෙන් අපේක්ෂිත ප්‍රතිඵල වෙත ළඟාවීම පහසු කෙරේ.

මෙලෙස භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ පරිදි ආනාපානසති භාවනාව ඔස්සේ සතර සතිපට්ඨානය සම්පූර්ණත්වයට පත්වීමේ දී රූපාදි පංචුපාදනස්කන්ධය ම එකට ගෙන හටගැනීම් නිරුද්ධවීම් දැකීමට සමත් වෙයි. මෙලෙස දිවයන ආධ්‍යාත්මික ගමන් මගෙහි ක්‍රමයෙන් **සත්තිස් බෝධිපාක්ෂික ධර්ම** ම සම්පූර්ණත්වයට පත් වේ.

## කායානුපස්සනාව

මහාසතිපට්ඨාන සූත්‍රයට අනුව සතර සතිපට්ඨානයෙහි මුල් ම පියවර කයෙහි කය අනුව නුවණින් මෙනෙහි කිරීමයි. එනම් තමාගේ භෞතික කය සහ ඊට සම්බන්ධ අංශයන්හි ක්‍රියාකාරීත්වය පිරිසිඳ දැනීම ඉලක්ක කොට ගෙන ශරීරය පිළිබඳ ඇති ආත්ම දෘෂ්ටිය දුරුකරලනු සඳහා සිහිය වැඩීමයි. මෙහි දී සතර සතිපට්ඨානය සඳහා ම පොදුවේ දෙන උපදෙසක් නම් 'ආතාපී' කෙලෙස් තවන වැර ඇතිව, 'සම්පජානො' නුවණින් මෙනෙහි කොට 'සතිමා' සිහියෙන් යුතුව 'විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්සං' ලෝකය පිළිබඳව දැඩි ලෝභය හා දෙම්නස දුරුකොට මෙම භාවනාව ප්‍රගුණ කළ යුතු ය යන්නයි. ඒ අනුව සිත පිහිටවිය යුත්තේ රාග, ද්වේෂ, මෝහ යන කෙලෙස් දුරුකරලීම ඉලක්ක කොට නුවණින් මෙනෙහි කොට සිහියෙන් යුතුව ලොවට ඇති දැඩි ඇල්ම හා දෙම්නස් දුරුකරලමින් බව ආරම්භයෙහි දී ම අවධාරණය කොට තිබේ.

1. **ආනාපානසති** :- කායානුපස්සනාවෙහි මුල් පියවර හුස්ම ගැනීම හා පිටකිරීම පිළිබඳ වූ සිහිය නම් වූ ආනාපාන සතියයි. දක්ෂ ලී වඩුවෙකු ලී ඉරන විට තම කියත ඇදීමේ දී එහි ක්‍රියාකාරීත්වය ගැන සිහියෙන් සිටින්නාක් මෙන් තම ශරීරයෙහි නිරතුරුව සිදු වන හුස්ම ගැනීම හා හෙළීම පිළිබඳව සිහියෙන් සිටින ලෙස මෙමගින් උපදෙස් දේ. මෙහි දී ස්වාභාවිකව සිදුවන ස්වසනයට අදාළව සිහියෙන් හුස්ම ගනිමින් දීර්ඝව හුස්ම ගැනීමේ දී දීර්ඝව හුස්ම ගන්නා බවත් හ්‍රස්වව හුස්ම ගැනීමේ දී හ්‍රස්වව හුස්ම ගන්නා බවත් සියලු හුස්ම කය පිළිබඳවත් හුස්ම සංසිඳුවමිනුත් වශයෙන් හුස්ම ගැනීමේ දී හා හෙළීමේ දී කායිකව සිදුවන ක්‍රියාකාරීත්වය පිළිබඳ මනා සිහියෙන් ක්‍රියා කිරීම අවධාරණය කොට තිබේ.

මෙලෙස සිහිය ප්‍රගුණ කිරීමේ දී තමාගේ කය පිළිබඳව වැඩි අවධානයෙන් ක්‍රියා කරන අතර අන් අයකුගේ ශරීරයක් පිළිබඳව පෙනී යාමේ දී ඒ පිළිබඳව ද සිහිය යෙදීම දක්වා තිබේ. මෙහි අවසානයට සඳහන් කොට ඇත්තේ හුස්ම ගැනීම හා හෙළීම තුළින් ඇතිවන ශාරීරික ක්‍රියාකාරීත්වයේ හටගැනීමේ හා නිරුද්ධ වීමේ ස්වභාවය වූ අනිත්‍යතාව නුවණින් මෙනෙහි කරන ලෙසයි. මෙහි ප්‍රතිඵල වශයෙන් ඇත්තේ කයක් පමණක් ය යනුවෙන් සත්ත්ව සංඥාව දුරුකොට දැකීමේ නුවණක් හටගනී. එමගින් ශරීරය පිළිබඳ කිසිවක් උපාදන වශයෙන් නොගනී. කායානුපස්සනාව වැඩීමෙහි අරමුණ මෙමගින් පැහැදිලි වේ.

2. **ඉරියාපථ** :- යාම, සිටීම, හිඳීම, සැතපීම යන සිව් ඉරියව්ව ම පිළිබඳ මනා සිහියෙන් සිටිමින් සත්ත්ව සංඥාව දුරුවන අයුරින් මෙනෙහි කරමින් ලොවෙහි කිසිවකට නොඇලී සිටීම ඉරියාපථ පියවරේ දී සිදු කෙරේ.

**3. සම්පජඤ්ඤය** :- නිතිපතා අවදි වූ මොහොතේ පටන් නින්දට යනතුරු සිදුවන කෑම්, බීම්, සැතපීම්, හැඳීම්, සිටීම් ආදි සියලු ශාරීරික ක්‍රියාකාරීත්වයන් පිළිබඳ මනා සිහියෙන් සිටිමින් ඒ කිසිවක් ආත්ම කර නොගනිමින් ඇත්තේ කයක් පමණි යන නුවණ ඇති කර ගැනීම සම්පජඤ්ඤ පබ්බයෙන් සිදු කෙරේ.

**4. පටික්කුල මනසිකාර** :- ශරීරය නිර්මාණය වී ඇති කෙස්, ලොම්, නිය, දත්, සම් ආදි දෙතිස් කුණපයන් පිළිබඳ සිහියෙන් සිටිමින් කය පිළිබඳ තවදුරටත් නුවණින් බලමින් ආත්ම සංඥාව දුරුවන ලෙස සිහිය දියුණු කිරීම මෙහි දී සිදුවේ. කට ගැටගැසූ විවිධ ධාන්‍ය වර්ගවලින් සමන්විත මල්ලක් ලෙස මෙම ශරීරය බැලීමට මෙමගින් හුරු කෙරේ.

**5. ධාතු මනසිකාර** :- අපගේ භෞතික ශරීරය සෑදි මූලික පදර්ථ හතර වන පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහාභූත රූපයනට සිත තබා නුවණින් බැලීම මෙහි දී සිදු කෙරේ. එමගින් ද සත්ත්ව සංඥාව දුරුවන අයුරින් මෙනෙහි කෙරේ. ගවයකු ඝාතනය කොට සතර මං හන්දියක තබා ඇති විට හරකා යන සංඥාව දුරුව ඇත්තාක් මෙන් මිනිස් ශරීරය සෑදි මූලික පදර්ථ වන මෙම කොටස් හතරට හිත තබා බලන විට තම ශරීරය පිළිබඳව ඇති ආත්ම දෘෂ්ටිය ක්‍රමයෙන් පහව යයි.

**6. නවසීවථික** :- මිනිස් ශරීරය මරණයට පත් වූ විට එය ක්‍රමයෙන් ඇට සැකිල්ලක් දක්වා විකාශය වන අවස්ථා පිළිබඳ නුවණින් මෙනෙහි කිරීම මෙමගින් සිදු කෙරේ. ඒ අනුව සිහිය දියුණු කිරීමේ දී ද ශරීරය පිළිබඳව ඇති දැඩි ඇල්ම, ආත්ම සංඥාව දුරුවේ.

ඉහත දැක්වූ ආකාරය හය අනුව කය පිළිබඳව මෙනෙහි කිරීමේ දී ඇත්තේ කයක් පමණක් බවත් නිත්‍ය වූ ආත්ම වශයෙන් ගතහැකි කිසිවක් මේ කය තුළ නැති බවත් අවබෝධ වේ. මෙය තම සිරුර පිළිබඳව මෙන් ම අන් අයගේ ශරීර දෙසට ද අදාළ කොට බලයි. එම අවබෝධයත් සමග තම ආධ්‍යාත්මික ලෝකය පිළිබඳ කිසිවක් ආත්ම වශයෙන් උපධි වශයෙන් නොගනී (අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. න ච කිඤ්චි ලොකෙ උපාදියති).

කය පිළිබඳ මෙබඳු අවබෝධයක් ලබා තවදුරටත් තම ජීවිතය පිළිබඳ අවබෝධය ලබා ගනු වස් සතිපට්ඨානයෙහි යෙදෙන ශ්‍රාවකයා තම වේදනා පිළිබඳව ද සිහිය හා නුවණ පුහුණු කරයි.

## වේදනානුපස්සනාව

වේදනානුපස්සනාව යනු ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රිය ඔස්සේ තමාට දැනෙන සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ, සාමිස සුඛ, නිරාමිස සුඛ, සාමිස දුක්ඛ, නිරාමිස දුක්ඛ, සාමිස අදුක්ඛමසුඛ, නිරාමිස අදුක්ඛමසුඛ යන වේදනා පිළිබඳව මනාව සිහිය පවත්වා ගැනීමයි. එලෙස සිහියෙන් සිටින අතර මනා නුවණින් එහි හටගැනීම් නිරුද්ධවීම් පිළිබඳ අනිත්‍යතාව දැකීම ද මෙහි දී සිදු වේ. ඒ අනුව ඇත්තේ වේදනා පමණක් බවත් සත්ත්වයකු වශයෙන් ගත හැකි කිසිවක් නොමැති බවත් ප්‍රත්‍යක්ෂ වේ. තවද ස්පර්ශය ඇතිවිට වේදනාව හටගන්නා බවත් ස්පර්ශය නිරුද්ධ වන විට වේදනාව නිරුද්ධ වන බවත් මෙහි දී අවබෝධ වේ. ඒ සමග ම වේදනා ලෝකය පිළිබඳ කිසිවක් උපධි වශයෙන් තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් නොගනී (*අත්ථි වේදනාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. න ච කිඤ්චි ලොකෙ උපාදියති*).

වේදනානුපස්සනාවෙහි ප්‍රතිඵල වශයෙන් සතර ආහාරයන් අතුරින් ඵස්සාහාරය ප්‍රකට වන අතර ස්කන්ධ පංචකය අතුරින් වේදනාස්කන්ධය ප්‍රත්‍යක්ෂ කර ගැනීමේ හැකියාව ඇතිවේ. තම වේදනා පිළිබඳව ද අන් අයගේ වේදනා පිළිබඳව ද මෙලෙස නුවණින් මෙනෙහි කරයි. මෙහි දී මුලින් තමාගේ වේදනා පිළිබඳවත් පසුව අන් අයගේ වේදනා පිළිබඳවත් සිහිය හා නුවණ පවත්වයි.

## චිත්තානුපස්සනාව

සරාග, වීතරාග, සදෙස, වීතදෙස, සමොහ, වීතමොහ, සංඛිත්ත, වික්ඛිත්ත, මහග්ගත, අමහග්ගත, සඋත්තර, අනුත්තර, සමාහිත, අසමාහිත, විමුත්ත, අවිමුත්ත වශයෙන් සිතෙහි පවත්නා ස්වභාවයන් පිළිබඳව සිහියෙන් සිටිමින් එහි හටගැනීම් හා නිරුද්ධවීම් සංඛ්‍යාත අනිත්‍යතාව නුවණින් දකිමින් ඒ කිසිවක් ආත්ම වශයෙන් නොගෙන සිටීම චිත්තානුපස්සනාවෙන් සිදු කෙරේ. මෙලෙස චිත්තානුපස්සනාව වැඩීමේ ප්‍රතිඵල වශයෙන්, ඇත්තේ සිතක් පමණක් ය සත්ත්ව පුද්ගල වශයෙන් ගත හැකි ආත්මීය යමක් නැත ය යන නුවණ පහළ වීමෙන් කිසිවක් පිළිබඳව උපධි හට නොගනී. තම සිත පිළිබඳව සිහියෙන් හා නුවණින් දකින ශ්‍රැතවත් ශ්‍රාවකයා අන් අයගේ ක්‍රියාකාරීත්වයන් තුළින් ඒ අයගේ සිත් පිළිබඳව ද මෙබඳු නුවණක් ඇති කර ගනී. මෙම අවබෝධයත් සමග ලොවෙහි කිසිවකට නොඇලෙන සිතක් ඇති කර ගනී (*අත්ථි චිත්තන්ති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. න ච කිඤ්චි ලොකෙ උපාදියති*).

චිත්තානුපස්සනාව වැඩීමේ ප්‍රතිඵල වශයෙන් සතර ආහාර අතුරින් විඤ්ඤාණාහාරය ප්‍රකට වන අතර ස්කන්ධ පංචකය අතුරින් විඤ්ඤාණස්කන්ධය පිරිසිඳ දැක ගැනීමේ හැකියාව ද උදාවේ.

මහාසතිපට්ඨාන සූත්‍රයේ දැක්වෙන පරිදි ආනාපානසති, ඉරියාපථ, සම්පජඤ්ඤ, පටික්කූල, ධාතු, නවසීවථික වශයෙන් කය පිළිබඳව කායානුපස්සනාව වැඩීමෙන් කයෙහි පවත්නා නිසරු බව මෙන් ම අසුභ බව ප්‍රත්‍යක්ෂ වේ. පවත්නේ හුදු කයක් පමණක් බවත් ඊට අයත් ආත්ම වශයෙන් ගත හැකි පරමාර්ථමය වූ සත්ත්වයෙක් පුද්ගලයෙක් නොමැති බවත් අවබෝධ වීමෙන් තම ආධ්‍යාත්මික කය පිළිබඳ ව මෙන් ම බාහිර කයෙහි ද පවත්නා සියලු ඇලීම් ක්‍රමයෙන් දුරුවීමට අවශ්‍ය ඥනය ලැබේ. කය පිළිබඳ මෙකී අවබෝධය සහිත ව තවදුරටත් සතිපට්ඨානයෙහි යෙදෙන ශ්‍රැතවත් ශ්‍රාවකයා වේදනා පිළිබඳ ව ද නුවණින් මෙනෙහි කරයි. සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ වශයෙන් අත්විඳින ත්‍රිවිධ දුක්ඛය සාමිස, නිරාමිස වශයෙන් සයාකාර ව තමා පිළිබඳ ව මෙන් ම බාහිර වේදනා පිළිබඳව ද ඇතිවීම් නැතිවීම් අනුව නුවණින් මෙනෙහි කිරීමෙන්, පවත්නේ වේදනා පමණක් බවත් පරමාර්ථ වශයෙන් එහි විඳින්නෙක් නොමැති බවත් නුවණින් අවබෝධ වේ. එවිට කිසිදු වේදනාවක් තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් ග්‍රහණයට නොයයි. කය පිළිබඳව මෙන් ම වේදනා පිළිබඳ ව ද නුවණින් බලන ශ්‍රාවකයා ඉන් නොනැවතී තවදුරටත් සතිපට්ඨානයෙහි යෙදෙමින් සිතෙහි සිත අනුව නුවණින් බලමින් කල් ගෙවයි. මෙහි දී සිතට පහළ වන සරාග - වීතරාග, සදෝස - වීතදෙස, සමෝහ - වීතමෝහ, සංඛිත්ත - වික්ඛිත්ත, මහග්ගත - අමහග්ගත, සඋත්තර - අනුත්තර, සමාහිත - අසමාහිත, විමුත්ත - අවිමුත්ත වශයෙන් සිතෙහි හටගන්නා කුසලාකුසල සිතිවිලි ඇතිවීම් නැතිවීම් වශයෙන් චින්තනයෙහි යෙදෙමින් චිත්තානුපස්සනාව වඩයි. හේතුඵල දහමට අනුගත සිතක්, සිතීමක් පැවැතිය ද සිතන්නෙක් නැත යන අවබෝධය මෙමගින් ලැබීමත් සමග නොඇලීම දියුණු වෙයි. මෙලෙස කය පිළිබඳව සිහිය හා නුවණ වැඩීම අරඹා වේදනා, චිත්ත පිළිබඳ ව ද සිත භාවිත කරන නුවණැති ශ්‍රාවකයා තම භාවිත සිත වඩාත් සංකීර්ණ අංශයක් වූ ධම්මානුපස්සනාව වෙත යොමු කරයි. කායානුපස්සනාදි පළමු සතිපට්ඨාන තුනෙහි යළි යළිත් සිත භාවිත කොට තිබීම ධම්මානුපස්සනාව සඵල වීමට හේතු වන්නකි.

## ධම්මානුපස්සනා

ඉහත සඳහන් පරිදි කාය, වේදනා, චිත්ත පිළිබඳව සිහිය හා නුවණ දියුණු කිරීමෙන් අනතුරුව ඊ ළඟට පිවිසෙන්නේ සිතිවිලි හෙවත් සංඥ - චේතනා අවබෝධ කර ගැනීම ඉලක්ක කොට ගත් ධම්මානුපස්සනාව වෙතයි. මෙය වැඩීමෙන් සතර ආහාර අතුරින් මනෝසංචේතනාහාරය ප්‍රකට වේ.

'ධම්ම' (සං.ධර්ම) යනු බුදුදහමෙහි සඳහන් විවිධ අර්ථ සඳහා භාවිත සංකීර්ණ පදයකි. 'සබ්බෙ ධම්මා අනත්තා' යන්නෙන් ලෞකික හා ලෝකෝත්තර ධර්මතා දැක්වීම සඳහා ද 'වය ධම්මා සංඛාරා'

යන්නෙන් සංඛත ධර්මයන් දැක්වීම සඳහා ද 'යො ඛො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා' යන්නෙන් බුදුරදුන් විසින් දේශිත සූත්‍ර ධර්ම දැක්වීම සඳහා ද 'ධම්මො'සධ සමං නත්ථි එතං පිවථ භික්ඛවො' මෙන් ම 'ස්වාක්ඛාතො භගවතා ධම්මො' යන්නෙන් සියලු බුද්ධවචනය දැක්වීම සඳහා ද 'ධම්මෙසු ධම්මානුපස්සී විහරති' යන්නෙන් කුසලාකුසල ධර්ම දැක්වීම සඳහා ද '...බුද්ධෙ වා ධම්මෙ වා සංඝෙ වා මග්ගෙ වා පටිපදය වා ....' යන්නෙන් රත්නත්‍රය අතුරින් ධර්ම රත්නය දැක්වීම සඳහා ද 'ධම්ම' යන්න භාවිත කොට ඇත. මේ අතර මහාසතිපට්ඨාන සූත්‍රයෙහි දැක්වෙන 'ධර්මයන් පිළිබඳ ව ධම්මානුපස්සී ව වාසය කරන්න' යනුවෙන් කෙරෙන අනුශාසනාවට අනුව ධර්ම යන්නෙන් විශේෂයෙන් අදහස් කෙරෙන්නේ සාංසාරික පැවැත්මට හේතුවන නීවරණ, පංචුපාදනස්කන්ධ ආදි අකුසල ධර්ම හා සාංසාරික නිර්වෘතියට හේතුවන බොජ්ඣංග, ආර්ය සත්‍යය යනාදි කුසල දහම් පිළිබඳවයි. 'අනුපස්සනා' යනු යමක් අනුව සිතීමයි. ඒ අනුව 'ධම්මානුපස්සනා' යනු කුසලාකුසල ධර්ම අනුව යළි යළිත් නුවණින් මෙනෙහි කිරීමයි.

සතර සතිපට්ඨානයන් අතුරින් වඩාත් වැදගත් මෙන් ම සංකීර්ණ අංගය වන්නේ අවසානයට එන ධම්මානුපස්සනාවයි. සඤ්ඤා, චේතනා යන චෛතසික මෙන් ම සඤ්ඤා, සංඛාර යන ස්කන්ධද්වය ද මනෝසංචේතනාහාරය ද පිරිසිඳ දැනීමටත් අනාත්ම දෙයෙහි ආත්ම සංඥාව (අනත්තෙ අත්තසඤ්ඤා) නමැති විපල්ලාසය දුරුවීමටත් ධම්මානුපස්සනාව බෙහෙවින් උපකාරී වේ. ධම්මානුපස්සනාව වඩමින් අකුසල ප්‍රහීණ වන ආකාරයත් කුසලය වැඩෙන ආකාරයත් සාංදෘෂ්ටික වශයෙන් නුවණින් දකිමින් නිවන් මගෙහි හික්මෙන්නා ක්‍රමයෙන් දුකින් මිදෙමින් පරම සැපත වෙත පියනගයි.

ධම්මානුපස්සනාව යටතේ නීවරණ, ඛන්ධ, ආයතන, බොජ්ඣංග, ආර්ය සත්‍ය යන අකුසල හා කුසල යන දෙඅංශය පිළිබඳව ම යළි යළිත් නුවණින් විමසා බැලේ. මෙහි දී විශේෂයෙන් ආර්ය සත්‍යය පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කෙරේ.

1. **නීවරණ** :-

නීවරණ යනු නිවන ආවරණය කෙරෙන අකුසල පාර්ශ්වය නියෝජනය කෙරෙන කෙලෙස් හෙවත් සංයෝජනයන් ය. එනම් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන පහයි. නුවණැති ශ්‍රැතවත් ශ්‍රාවකයා තමා තුළ දනට පවත්නා කාමච්ඡන්දයේ ඇති බව ද නැති කාමච්ඡන්දයේ නැති බව ද නූපන් කාමච්ඡන්දයේ ඉපදීම ද උපන් කාමච්ඡන්දයේ ප්‍රහාණය ද ප්‍රහීණ වූ කාමච්ඡන්දයේ යළි නූපදීම ද නුවණින් දකියි.

ව්‍යාපාද ආදි සෙසු නීවරණ පිළිබඳව ද මෙලෙසින් ම යළි යළිත් නුවණින් බලයි. තමා පිළිබඳව මෙන් ම මෙරමා පිළිබඳ ව ද මෙලෙස බැලීමෙන් සමුදය (හටගැනීම්), අත්ථංගම (නිරුද්ධවීම්) ද නුවණින් දකිමින් අනිත්‍ය ස්වභාවය ද පසක් කරයි. නීවරණ පිළිබඳව මෙලෙස නුවණින් බැලීමේ ප්‍රතිඵල වශයෙන් ලොව කිසිවක් තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් නොගෙන නොඇලී, ගැටීම්වලින් තොර ව විසිය හැකි ලෙස සිය මනස සකසා ගනී.

මෙහිලා තම සිහිය හෙවත් අවධානය නිරතුරු ව පවත්වා ගැනීම වැදගත් වේ. භෞතික වශයෙන් තමා සමීපයෙහි ඇති දෙයක් ඇතැයි ද එය නැති වූ විට නැතැයි ද පළමු ව නොතිබුණු දෙයක් තමා වෙත පැමිණීමේ දී එසේ පැමිණීම ද පැමිණි දෙයක (නැවත නොපැමිණෙන ලෙස) ඉවත් ව යාම ද එලෙස ඉවත් ව ගිය දෙයක් යළි කිසිදු නොපැමිණෙන්නේ යැයි ද යම් අවබෝධයක් වෙයි ද එමෙන් ම මානසික ස්වභාවයක් වූ කාමච්ඡන්දය පිළිබඳ ව ද මනා සතිමත් බවකින් සිටීම මෙහි දී අවධාරණය කෙරේ. මෙලෙස සිහියෙන් සිටීමෙන් කාමච්ඡන්දය දිගු කලක් සිතෙහි නොරඳන අතර එය වහා දුරු කර ගැනීමට අවකාශ සැලසේ. ආරම්භයේ දී පැමිණි කාමච්ඡන්දය දුරු කරන අතර කල් යාමේ දී නිරතුරුව සතිපට්ඨානය භාවිත කිරීමේ ප්‍රතිඵල වශයෙන් සිතට එබඳු අදහසක් පැමිණෙත් ම වහාම ඉන් සිත මුදවා ගැනීමට හැකියාව ලැබේ. ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙහි භාවිතින්ද්‍රිය පුද්ගලයාගේ ලක්ෂණ දක්වන අවස්ථාවෙහි මේ පිළිබඳව කරුණු සඳහන් වේ. ඒ අනුව චක්ඛු ඉන්ද්‍රිය ඇසුරින් රූප අරමුණු කොට

නීවරණයක් ජනිත වීමේ දී ඇසි පිය ගසන තරම් ක්ෂණයක දී ද සෝත ඉන්ද්‍රිය ඇසුරින් ශබ්ද අරමුණු කොට නීවරණයක් ජනිත වීමේ දී බලවත් පුරුෂයෙක් අසුරු ගසන තරම් වේලාවක දී ද ඝාන ඉන්ද්‍රිය ඇසුරින් ගන්ධය අරමුණු කොට නීවරණයක් ජනිත වීමේ දී මඳක් නැඹුරු කළ පියුම්පතෙහි දිය බිඳක් පෙරළෙන තරම් ක්ෂණයක දී ද ජිව්හා ඉන්ද්‍රිය ඇසුරින් රස අරමුණු කොට යම් නීවරණයක් හට ගැනීමේ දී දිවගට පත් කෙළ පිඩක් වහා ඉවත් කරන තරම් වේලාවක දී ද කාය ඉන්ද්‍රිය ඇසුරින් ඵොට්ඨබ්බය අරමුණු කොට යම් නීවරණයක් ජනිත වීමේ දී බලවත් පුරුෂයෙන් හැකුළු අතක් දිගු කරන නොහොත් දිගු කළ අතක් හකුළන තරම් ක්ෂණයක දී ද මන ඉන්ද්‍රිය ඇසුරින් ධර්ම අරමුණු කොට යම් නීවරණයක් ඇති වීමේ දී අධික ලෙස රත් වූ යකඩ බඳුනකට දියබිඳක් දැමූ විට එය සිඳී යන තරම් ක්ෂණයක දී ද වශයෙන් ඉතා ස්වල්ප කාලයක දී සිතට නැගෙන නීවරණ දුරු ව සිත උපේක්ෂාවෙහි පිහිටන බව සඳහන් වේ.

ධම්මානුපස්සනාවට අනුව නීවරණ පිළිබඳ ව සතිමත් බවෙහි යෙදීමේ ප්‍රතිඵල වශයෙන් නීවරණ හේතුවෙන් සිතට නැගෙන පීඩාව, පරිදහය දුරු කර ගැනිමට අවස්ථාව උදවේ. කෙලෙස් දුරු කිරීමෙන් සිතෙහි ප්‍රසන්න බව ඇති වීමෙන් හටගන්නා ප්‍රීතිය නිසා තව තවත් ධර්මයෙහි යෙදීමේ නියැලෙයි.

**2. ස්කන්ධ :-**

බුදුදහමෙහි සත්ත්ව සංයුත්තිය පිළිබඳ ප්‍රධාන ඉගැන්වීම 'ස්කන්ධ' (පා.ඛන්ධ) විග්‍රහය මගින් ඉදිරිපත් කෙරේ. 'ස්කන්ධ' යනු 'ගොඩ', 'සමූහය', 'රාශිය' යන පදවලින් සිංහලයෙහි දැක්වෙන ඒකරාශී වූ දෙය යන අදහස ගෙනදේ. සිත, කය සහිත සත්ත්වයකුගේ සමස්ත සංයුතිය ස්කන්ධ හෙවත් සමූහ පහක් යටතේ මෙහි දක්වා තිබේ. එනම් රූපස්කන්ධ, වේදනාස්කන්ධ, සංඥාස්කන්ධ, සංස්කාරස්කන්ධ, විඥානස්කන්ධ යනුයි. දුක පිළිබඳ විග්‍රහයක යෙදෙන බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවන්හි දී උපාදානස්කන්ධ පංචකය පිළිබඳව කරුණු දේශනා කොට ඇත. ඒ අතර මජ්ඣිම නිකායේ භද්දෙකරත්ත හා මහාපුණ්ණම සූත්‍ර, සංයුත්ත නිකායේ ඛන්ධ සූත්‍ර , සංයුත්ත නිකායේ සමස්ත ඛන්ධ වග්ගය ප්‍රධාන වේ.

කායානුපස්සනා ආදි සතිපට්ඨාන සතර වැඩීමේ දී රූපාදි ස්කන්ධ පිළිබඳ ව අනිත්‍ය දුක්ඛ, අනාත්ම, නිබ්බින්ද, විරජ්ජ, නිරෝධ, පටිනිස්සග්ග වශයෙන් අනුපස්සනා කළ යුතු බව දැක්වේ. එහි ප්‍රතිඵල වශයෙන් නිත්‍ය, සුඛ ආදි මිථ්‍යා විපල්ලාස දුරුවන අයුරු ද සඳහන් ව ඇත. 'සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා' යන දුක පිළිබඳ විග්‍රහයට අනුව සත්ත්වයා අත්විඳින සියලු දුක් සමූහය සංක්ෂිප්ත වශයෙන් උපාදානස්කන්ධ පඤ්චකය තුළට ගොනු කළ හැකි ය. සංයුත්ත නිකායේ ඛන්ධ සූත්‍රයට අනුව 'දුක්ඛ ආර්ය සත්‍යය' යනුවෙන් එකලාව ම දක්වා ඇත්තේ 'පංචුපාදානස්කන්ධය' වශයෙනි (කථමඤ්ච භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: පංචුපාදනස්ඛන්ධාතිස්ස වචනීයං.) . රූපාදි ස්කන්ධ මම, මගේ, මගේ ආත්මය ලෙස සිතා තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් ග්‍රහණය කර ගැනීම හේතුවෙන් සත්ත්වයා අපමණ දුකකට පත් ව අනන්ත සසරෙහි දිගු ගමනක යෙදෙමින් සිටියි.

ස්කන්ධ පංචකය අතුරින් 'රූප' යනු පඨවි, ආපෝ, තේජෝ, වායෝ හා උපාදය රූප 24 { (ප්‍රසාද රූප 5 (චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය), ගෝචර රූප 4 (රූප, ශබ්ද, ගන්ධ, රස), භාවරූප 2 (ස්ත්‍රීභාව, පුරුෂභාව), හදයවත්ථු රූප, ජීවිත රූපය, කබලිංකාර ආහාර, ආකාශ ධාතු, විඤ්ඤත්ති රූප 2 (කාය විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති), විකාර රූප 3 (ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා), ලක්ෂණ රූප 4 (උපචය, සන්තති, ජරතා, අනිච්චතා) } යන අටවිසි රූපයි. 'වේදනා' යනු චක්ඛුසම්ඵස්සජාවේදනා, සොතසම්ඵස්සජාවේදනා, ඝානසම්ඵස්සජාවේදනා, ජිව්හාසම්ඵස්සජාවේදනා, කායසම්ඵස්සජාවේදනා, මනොසම්ඵස්සජාවේදනා යන වේදනා හයයි. 'සඤ්ඤ' යනු රූපසඤ්ඤ, සද්දසඤ්ඤ, ගන්ධසඤ්ඤ, රසසඤ්ඤ, ඵොට්ඨබ්බසඤ්ඤ, ධම්මසඤ්ඤ යන හයයි. 'සංඛාර' යනු රූපසඤ්චේතනා, සද්දසඤ්චේතනා, ගන්ධසඤ්චේතනා, රසසඤ්චෙතනා, ඵොට්ඨබ්බසඤ්චේතනා, ධම්මසඤ්චේතනා යන හයයි. 'විඤ්ඤණ' යනු චක්ඛුවිඤ්ඤණ, සොතවිඤ්ඤණ, ඝානවිඤ්ඤණ, ජිව්හාවිඤ්ඤණ, කායවිඤ්ඤණ, මනෝවිඤ්ඤණ යන හයයි. ස්කන්ධ පංචකය හා එහි අනුකොටස් පරමාර්ථ වශයෙන්

මෙලෙස බෙද දක්වුව ද පියෙවි ඇසට පෙනෙන්නේ මේ සියල්ල ඒකරාශී වූ  සිත හා කය සහිත සත්ත්වයෙකි. නැතහොත් සිතින් තොර වූ අජීවී රූපයකි. පුද්ගලයා හෝ සත්ත්වයා යනුවෙන් අප ව්‍යවහාර කරන තැනැත්තා මෙකී ස්කන්ධ පංචකයක එකතුවකි. ස්කන්ධ පංචකය තනි පුද්ගලයෙක් ලෙස සලකා බැලීමේ දී ඝණසංඥාව නිසා ඇතිවන කෙලෙස් දුරුවීමට නම් ඒවා විශ්ලේෂණය කොට 'මේ රූපය ය, මේ රූපයේ හටගැනීම ය, මේ රූපයේ අස්තංගමය ය' යනුවෙන් නුවණින් ප්‍රත්‍යවේක්ෂණය කළ යුතු ය. වේදනාදි සෙසු ස්කන්ධ පිළිබඳ ව ද මෙලෙස පරාමර්ශනය කළ යුතු ය. එහි ප්‍රතිඵල වශයෙන් සත්ත්වයා ලෙස අප ව්‍යවහාර කරන මේ සිත සහිත රූපය තුළ සත්ත්ව වශයෙන් පවත්නේ ස්කන්ධ පංචකය යන ධර්මයන් පමණක් ය යන නුවණ පහළ වීමෙන් එහි කෙලෙස් දුරුවේ.

සත්ත්ව සන්තානගත සංයෝජන අතර සක්කාය දිට්ඨිය දුරු කිරීමට අපහසු සංයෝජනයකි. රූපාදී ස්කන්ධ පංචකය සහිත තම ජීවිතයෙහි තමා කැමැති ලෙස පාලනය කළ හැකි ස්වභාවයක් ඇතැයි යන හැඟීම සක්කාය දිට්ඨිය යන්නෙන් අදහස් වේ. කායාදි අනුපස්සනා සතරින් අපේක්ෂා කරන්නේ මෙම හැඟීම සන්තානයෙන් ඉවත් කිරීමයි. විශේෂයෙන් ධම්මානුපස්සනාව මේ සඳහා බෙහෙවින් වැදගත් වේ. රූප, වේදනාදී ස්කන්ධ පංචකය ස්ථාවර ව පවතී ය එය තම වසඟයෙහි පවත්නා ගත හැකි ය යන වැරදි දෘෂ්ටිය මත සක්කාය දිට්ඨිය රඳ පවතී. එනම් රූපය ආත්ම වශයෙන් ද ආත්මය රූපවත් යැයි ද ආත්මයෙහි රූපය ඇතැයි ද රූපයෙහි ආත්මය ඇතැයි ද වරදවා තේරුම් ගෙන සිටීමයි. වේදනාදි සෙසු ස්කන්ධ පිළිබඳව ද මෙලෙසින් ම සිතා සිටීම සක්කාය දිට්ඨියේ ලක්ෂණයයි. සතිපට්ඨානයෙහි ප්‍රතිඵල වශයෙන් මෙම මිථ්‍යා සංකල්පය ක්‍රමයෙන් ක්ෂය වී යයි.

**3. ආයතන ː-**

ධම්මානුපස්සනාවෙහි තවදුරටත් නියැළෙන ශ්‍රැතවත් ශ්‍රාවකයා චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන යන ආධ්‍යාත්මික ආයතන හය පිළිබඳ ව ද නුවණින් සම්මර්ශනයෙහි යෙදෙයි. සත්ත්වයා පිළිබඳ තවත් විග්‍රහයක් මෙහි දී ඉදිරිපත් කෙරේ. ඒ අනුව ඇස ද රූපය ද ඒ දෙක නිසා හටගන්නා සංයෝජන ද නූපන් සංයෝජනයාගේ ඉපදීම ද උපන් සංයෝජනයාගේ ප්‍රහාණය ද ප්‍රහීණ වූ සංයෝජනයාගේ නැවත නූපදීම ද නුවණින් බලයි. සෝත, ඝාන ආදි සෙසු ආයතන පිළිබඳව ද මෙලෙස බලයි. ආධ්‍යාත්මික ආයතන පිළිබඳව මෙන් ම බාහිර ආයතන පිළිබඳව ද හටගැනීම් නිරුද්ධවීම් වශයෙන් නුවණින් සලකා බැලීමේ දී සත්ත්ව සංඥාවෙන් තොරව ආයතන නමැති පරමාර්ථ ධර්මයන්හි පැවැත්ම වැටහීමත් සමග කිසිවක් සමග තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් මිශ්‍ර නොවී සිටියි.

**4. බොජ්ඣංග ː-**

නිර්වාණාවබෝධයට අංග (බෝධි අංග) වූ සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන බොජ්ඣංග ධර්ම සම්මර්ශනය කිරීම මෙහිදි සිදු කෙරේ. ඒ අනුව තමා තුළ ඇති සතිසම්බොජ්ඣංගය ඇතැයි ද තමන් තුළ නැති සතිසම්බොජ්ඣංගය නැතැයි ද නූපන් සතිසම්බොජ්ඣංගයාගේ ඉපදිම ද උපන් සතිසම්බොජ්ඣයාගේ වැඩීම හා පරිපූර්ණත්වය ද යළි යළිත් සිහිකරමින් වෙසෙයි. සිහිය හා නුවණ වැඩෙනු පිණිස ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන සෙසු අංග පිළිබඳව ද මෙලෙසින් සම්මර්ශනයෙහි යෙදෙයි.

සබ්බාසව සූත්‍රයට  අනුව භාවනා නමින් දක්වා ඇත්තේ බොජ්ඣංග ධර්ම වැඩීමයි. භාවනා නමින් වැඩිය යුතු අංග වශයෙන් බුදුදහමෙහි දක්වා ඇති කරුණු අතර සත්ත බොජ්ඣංගවලට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. විරාග නිශ්‍රිත ව නිරෝධ නිශ්‍රිත ව නිවනට යොමු වූවක් කොට වඩන බොජ්ඣංග ධර්මයන් නිසා කාමරාග, පටිඝ ආදි කොට ඇති අවිද්‍යාව අන්ත කොට ඇති සංයෝජන ධර්ම ක්‍රමයෙන් ප්‍රහීණ වේ. මෙලෙස නිර්වාණාවබෝධයට බෙහෙවින් උපකාරී වූ සත්ත බොජ්ඣංග ධර්ම තමා තුළ වැඩෙන අයුරු නුවණින් සම්මර්ශනය කිරීම ධම්මානුපස්සනාවේ මෙම අංගයේ පරමාර්ථය වේ.

**5. ආර්ය සත්‍යය :-**

දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන චතුරාර්ය සත්‍යය පිළිබඳ ව සවිස්තරාත්මක ව තත් වූ පරිදි නුවණින් සලකා බැලීම මෙහිදී සිදු වේ. දුක පිළිබඳ පරිපූර්ණ වැටහීමක් ලැබෙන මෙම අවස්ථාව ජීවිතයේ යථා තත්ත්වය අවබෝධ කර ගැනීමටත් හේතුඵල සම්බන්ධය වටහා ගැනීමටත් දුකින් නිදහස් වීමේ මාවත වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය මැනැවින් පසක් කර ගැනීමටත් මග පෙන්වයි.

දුක්ඛ සත්‍යය යටතේ ප්‍රථමයෙන් ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, අප්‍රිය සම්ප්‍රයෝග, ප්‍රිය විප්‍රයෝග, කැමැති දෑ නොලැබීම යනුවෙන් දක්වෙන දුකෙහි ප්‍රභේද සාකච්ඡා කෙරේ. මෙහිදී අවධාරණය කෙරෙන විශේෂ කරුණක් නම් සත්ත්වයාට දුක හටගන්නේ හුදෙක් ජාති, ජරා, ව්‍යාධි, මරණාදි කරුණු ඉපදීම නිසා නොව ජාති, ජරා, ව්‍යාධි, මරණාදියට පත්වන ලෝකයෙහි එබඳු තත්ත්වයකට පත් නොවී සිටීමට ඇති බලවත් කැමැත්ත හා ප්‍රාර්ථනය තමා කැමැති පරිදි ඉටු නොවීම නිසයි. මෙකී වැරදි සංකල්පනාව යමකු වෙතින් දුරු වුවහොත් ඔහුට ජරා, ව්‍යාධි, මරණාදි දුක් එළඹිය ද කායික ව යම් අපහසුතාවක් දැනුණ ද මානසික ව ඔහුට එම දුක ඇති නොවේ. එම දුක තමාගේ දුකක් ලෙස නොසලකයි. බුදුදහමින් අනුශාසනා කරන්නේ වැරදි දෘෂ්ටිය දුරු කරලීමට අවශ්‍ය සම්මා දිට්ඨිය ලබාදීමටයි. දුක පිළිබඳ විග්‍රහය බුදුදහමේ ප්‍රධාන ඉගැන්වීමක් වන අතර එය ශ්‍රද්ධාව වර්ධනය වීමට ද හේතු (දුක්ඛූපනිසා සද්ධා) වන්නකි. ධම්මානුපස්සනාවෙහි ආර්යසත්‍ය විග්‍රහයෙහි දුක්ඛ සත්‍යය පිළිබඳව මෙනෙහි කිරීමේ දී ජාති, ජරා ආදි දුක්ඛයන් තමා වෙත පැමිණෙන බවත් ජාති, ජරා ආදිය තමා වෙත නොයේවා යැයි ප්‍රාර්ථනා කළ ද එය ඉටු නොවීම නිසා දුක හටගන්නා බවත් නුවණින් දකියි.

දුක්ඛ සත්‍යය නුවණින් සලකා බලා ඉන්පසු දුක්ඛ සමුදය හෙවත් දුකට හේතුව නුවණින් සලකා බලයි. මෙහිදී දුකට හේතුව (දුක්ඛ සමුදය) වන පුනර්භවය ඇති කෙරෙන නන්දිරාගයෙන් යුතු (කාම, භව, විභව යන) ත්‍රිවිධ තෘෂ්ණාව ජනිත වන ස්ථාන 10ක් යටතේ කරුණු විස්තර කොට ඇත. එනම් :-

1. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන යන අභ්‍යන්තර ආයතන හය

ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ ඇස, කණ ආදි ඉන්ද්‍රියයන්හි ඇල්ම හෙවත් තෘෂ්ණාව නිසා බව නුවණින් දකියි. සෝතාදි සෙසු ඉන්ද්‍රිය පිළිබඳ ව ද මෙලෙස සම්මර්ශනයෙහි යෙදෙයි.

2. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යන බාහිර රූප හය

ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ රූපාදි බාහිර ඉන්ද්‍රියයන්හි ආශාව නිසා බව නුවණින් දකියි. ශබ්ද ආදි සෙසු අරමුණු පිළිබඳ ව ද මෙලෙසින් නුවණින් මෙනෙහි කරයි.

3. චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ යන ඇස් ආදි ඉන්ද්‍රිය විෂයයෙහි පහළවන සිත් හය

ලොව යම් ප්‍රිය ස්වභාවයක් මධුර ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ චක්ඛු ආදි විඤ්ඤාණ හය විෂයයෙහි ඇල්ම නිසා බව නුවණින් මෙනෙහි කරයි.

4. චක්ඛු සම්ඵස්ස, සෝත සම්ඵස්ස, ඝාන සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස, මනෝ සම්ඵස්ස යන ස්පර්ශ හය

ඇස, රූපය හා විඤ්ඤාණය යන කරුණු තුනෙහි එකතුවෙන් චක්ඛු සම්ඵස්සය උපදී. සෝතාදි සෙසු සම්ඵස්ස පිළිබඳ ව ද මෙසේ ම ය. ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම්

එය හටගන්නේ පිහිටන්නේ චක්ඛු සම්ඵස්ස ආදි ස්පර්ශ හයෙහි තෘෂ්ණාව නිසා බව නුවණින් මෙනෙහි කරයි.

5. චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා, ඝාන සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ සම්ඵස්සජා වේදනා යන වේදනා හය

ලොව යම් ප්‍රිය ස්වභාවයක් මධුර ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ ඇස, රූපය, විඤ්ඤාණය හා ස්පර්ශය ඇසුරින් හටගන්නා වේදනා පිළිබඳ තෘෂ්ණාව නිසා බව නුවණින් මෙනෙහි කරයි. සෝත සම්ඵස්සජා වේදනා ආදි සෙසු වේදනා පිළිබඳ ව ද මෙසේ ය.

6. රූප සඤ්ඤා, සද්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා, ඵොට්ඨබ්බ සඤ්ඤා, ධම්ම සඤ්ඤා යන හැඳිනීම් හය

ලොව යම් ප්‍රිය ස්වභාවයක් මධුර ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ ඇස, රූප, විඤ්ඤාණ, ඵස්ස, වේදනා ඇසුරින් හටගන්නා රූප සඤ්ඤා විෂයයෙහි බව නුවණින් මෙනෙහි කරයි. සද්ද සඤ්ඤා ආදි සෙසු සඤ්ඤා පිළිබඳව ද මෙසේ ම දත යුතු ය.

7. රූප සඤ්චෙතනා, සද්ද සඤ්චේතනා, ගන්ධ සඤ්චේතනා, රස සඤ්චේතනා, ඵොට්ඨබ්බ සඤ්චේතනා, ධම්ම සඤ්චේතනා යන චේතනා, සිතිවිලි හෙවත් සංස්කාර හය

ඇස, රූප, විඤ්ඤාණ, ඵස්ස, වේදනා, සඤ්ඤා යන රූප, වේදනා, සඤ්ඤා, විඤ්ඤාණ ඇසුරින් හටගන්නා චේතනා මෙයින් කියැවේ. ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ සඤ්චේතනා විෂයයෙහි බව නුවණින් මෙනෙහි කරයි. සද්ද සඤ්චේතනා ආදි සෙසු චේතනා පිළිබඳ ව ද මෙසේ ම ය.

8. රූප තණ්හා, සද්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා යන රූපාදි බාහිර අරමුණු පිළිබඳ ආශා හය

ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටා සිටින්නේ රූපය පිළිබඳ ආශාව නිසා බව නුවණින් මෙනෙහි කරයි. සද්ද තණ්හා ආදි සෙසු ආශාවන් පිළිබඳව ද එසේ ම ය.

9. රූප විතක්ක, සද්ද විතක්ක, ගන්ධ විතක්ක, රස විතක්ක, ඵොට්ඨබ්බ විතක්ක, ධම්ම විතක්ක යන විතර්ක හය

ලොව යම් ප්‍රිය ස්වභාවයක් මධුර ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටා සිටින්නේ රූපාදි විතර්ක හය පිළිබඳ තෘෂ්ණාව නිසා බව නුවණින් යළි යළිත් මෙනෙහි කරයි.

10. රූප විචාර, සද්ද විචාර, ගන්ධ විචාර, රස විචාර, ඵොට්ඨබ්බ විචාර, ධම්ම විචාර යන විචාර හය

ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටා සිටින්නේ රූප විචාර ආදි විචාර හය විෂයයෙහි තෘෂ්ණාව හෙවත් ඇල්ම නිසා බව නුවණින් මෙනෙහි කරයි.

යමෙකුට ලොව පවත්නා ඕනෑ ම දෙයක් පිළිබඳ තෘෂ්ණාවක් හටගනී නම් ඊට මුල් වන්නේ ඉහත කී කරුණු හැටෙන් කිසියම් කරුණකට ය. මෙමගින් චිත්ත සන්තානයෙහි තෘෂ්ණාව ජනිත වන සියලු ම ආකාර ඉතා පැහැදිලි ව මෙන් ම සවිස්තරාත්මක ව සඳහන් ව ඇත. දුක්ඛ සමුදය සත්‍යය පිළිබඳ ව දක්වෙන මෙම විග්‍රහය මගින් බුදුදහමේ හේතුඵල සිද්ධාන්තය ද ප්‍රකට වේ. එනම් දුක හටගන්නේ තෘෂ්ණාව නිසා ය යන අදහසයි.

දුක්ඛ නිරොධ සත්‍යයෙන් දක්වෙන්නේ දුක නිරුද්ධ කිරීමට අදාළ කරුණු ය. ඒ අනුව ඉහත දක්වූ චක්ඛු ආදි ආධ්‍යාත්මික ආයතන, රූපාදි බාහිර ආයතන, චක්ඛු විඤ්ඤාණය ආදි විඤ්ඤාණ හය, චක්ඛු සම්ඵස්සය ආදි ස්පර්ශ, චක්ඛු සම්ඵස්සජා වේදනාව ආදි වේදනා, රූප සඤ්ඤාව ආදි සඤ්ඤා, රූප සඤ්චේතනාව ආදි චේතනා, රූප තණ්හාව ආදි තෘෂ්ණා, රූප විතක්කය ආදි විතර්ක, රූප විචාරය ආදි විචාර යන හය බැගින් වූ කරුණු දහය අරහයා හැට තැනෙක්හි පවත්නා තෘෂ්ණාව නිරුද්ධ වන්නේ ද එකී ස්ථානයන්හි ම බව අවධාරණය කෙරේ. මින් දක්වෙන්නේ තෘෂ්ණාව හෙවත් දුක හට ගත්තේ යම් තැනෙක්හි ද එම තෘෂ්ණාව හෙවත් දුක නිරුද්ධ වන්නේ ද එම ස්ථානයන්හි ම බවයි. මෙකී යථාර්ථය නුවණින් මෙනෙහි කිරීමට මෙමගින් අනුශාසනා කෙරේ.

දුක්ඛනිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍යය හෙවත් මාර්ග සත්‍යය වශයෙන් දක්වෙන්නේ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන අංග අටෙන් යුත් ආර්ය මාර්ගයයි. මෙහි දී එම අංග එකිනෙකක් සවිස්තරාත්මක ව දක්වා තිබේ. නිර්වාණාවබෝධය සඳහා බුදුරදුන් වදාළ ඉගැන්වීම් රැසක් මෙම අංග අටෙහි ඇතුළත් ව ඇත. සක්කාය දිට්ඨිය නමැති පළමු සංයෝජනය පිරිසිඳ දන ගැනීමේ මාවත වශයෙන් ද දක්වා ඇත්තේ මෙම ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. ඇත, නැත හෙවත් ශාශ්වත, උච්ඡේද යන අන්තද්වය දුරු කොට මධ්‍යම ප්‍රතිපදාව ලෙස ඉගැන්වෙන මාර්ග සත්‍යයට අයත් කරුණු නුවණින් සම්මර්ශනය කිරීමෙන් ධර්මයන් අරහයා තව දුරටත් ඥානය උපදී. එමගින් සසර අනාදිමත් කාලයක් වර්ධනය කරමින් පැමිණි සුභ, සුඛ, නිත්‍ය, ආත්ම යන සතර විපල්ලාස දුරු වී දුකින් නිදහස් වීම සඳහා වූ ඥානය වර්ධනය වේ.

ඉහත දක්වූ චතුරාර්ය සත්‍යයට අයත් අංග සතර අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධතාවක් දක්වයි. එනම් දුක පිළිබඳ අවබෝධය ලැබූ පමණට දුක්ඛ සමුදය හෙවත් දුකට හේතුව වූ තෘෂ්ණාව පිළිබඳ ව අවබෝධ වී දුක්ඛ නිරෝධය වූ නිවන පිළිබඳ අභිරුචියක් ජනිත ව මාර්ගය වූ ආර්ය අෂ්ටාංගික මාවතෙහි ගමන් කිරීම ද සිදු වේ. චතුරාර්ය සත්‍යයෙහි දුක පිළිබඳ විග්‍රහයේදී හේතුඵල සිද්ධාන්තය පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහය ද ඇතුළත් වේ. එනම් 'තෘෂ්ණාව ඇති විට දුක ඇති වේ. තෘෂ්ණාව නැති වීමෙන් දුක නැති වේ' ය. තෘෂ්ණාව ඉපදීමෙන් දුක උපදී, තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් දුක නිරුද්ධ වේ ය යන සිද්ධාන්තයයි (*අස්මිං සති ඉදං හොති අස්මිං අසති ඉදං නහොති. ඉමස්ස උප්පාද ඉදං උප්පජ්ජති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති*).

1. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති.
2. දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති.
3. අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති.
4. නිබ්බින්දතො නන්දිං පජහති.
5. විරජ්ජන්තො රාගං පජහති.
6. නිරොධෙන්තො සමුදයං පජහති.
7. පටිනිස්සන්තො ආදානං පජහති.

සතර සතිපට්ඨානයට අනුගත ව රූපාදි ස්කන්ධ අනිත්‍ය වශයෙන් නුවණින් බැලීමෙන් නිත්‍ය සංඥාව ද දුක් වශයෙන් බැලීමෙන් සුඛ සංඥාව ද අනාත්ම වශයෙන් බැලීමෙන් ආත්ම සංඥාව ද නිබ්බිද (කළකිරීම්) වශයෙන් බැලීමෙන් නන්දිය (ඇලීම) ද විරජ්ජ (නොඇලීම්) වශයෙන් බැලීමෙන් රාගය ද නිරෝධ වශයෙන් බැලීමෙන් සමුදය (හටගැනීම) ද පටිනිස්සග්ග (අත්හැරීම්) වශයෙන් බැලීමෙන් ආදානය (දැඩි ව අල්වා ගැනීම) ද අත්හරියි. අනිත්‍ය ආදි සත් ආකාරයෙන් කාය, වේදනා, චිත්ත, ධම්ම පිළිබඳ ව සම්මර්ශනය කිරීමෙන් සිහිය හා නුවණ වැඩෙන අතර එම නුවණින් යළි යළිත් කායාදි ස්කන්ධ පංචකය නුවණින් දකියි. ස්කන්ධ පංචකය පිරිසිඳ දන ඊට ඇති ඇල්ම සපුරා දුරුකොට සසර දුකින් නිදහස් වීමේ ඒකායන මාවත මෙම සතර සතිපට්ඨානයෙන් පැහැදිලි කොට ඇත. එම නිසා භාග්‍යවතුන් වහන්සේ

සතර සතිපට්ඨානය කුශලරාශිය වශයෙන් කුසලරාසි සූත්‍රයෙහි දී හඳුන්වා දෙති (*කුසලරාසීʼති භික්ඛවෙ, වදමානො චත්තාරො සතිපට්ඨානෙ සම්මා වදමානො වදෙය්‍ය.*).

කය, වේදනා හා සිත පිළිබඳ ව යළි යළිත් යොනිසොමනසිකාරයෙහි යෙදීමේ ප්‍රතිඵල වශයෙන් ඒවායේ පවත්නා නිසරු බව යළි යළිත් ප්‍රකට වෙයි. ඒ අනුව කය පෙණපිඩක් මෙන් ද වේදනාව දියබුබුලක් මෙන් ද සඤ්ඤාව මිරිඟුවක් මෙන් ද සංඛාර කෙසෙල් කඳක් මෙන් ද සිත හෙවත් විඤ්ඤාණය මායාවක් ලෙස ද දකිමින් ජීවිතයේ යථාර්ථය පසක් කර ගනියි. ඇලීම් ගැටීම්වලින් මිදී උපේක්ෂාවෙන් යුතු ව ජීවිතය දෙස යථාර්ථවාදී ව බැලීමට හුරු වෙයි.

## සතර සතිපට්ඨානය

ඉහතින් දැක්වූ පරිදි සුතමය ඥාණය මැනැවින් සම්පාදනය කොටගෙන ආනාපානසති භාවනාව වැඩීමේ දී සතර සතිපට්ඨානය සම්පූර්ණත්වයට පත් වේ. එනම්

1. කායානුපස්සනා
2. වේදනානුපස්සනා
3. චිත්තානුපස්සනා
4. ධම්මානුපස්සනා

## සතර ඍද්ධිපාද

සතර සතිපට්ඨානය නමැති පිතෘවිෂය තුළ නිතර වාසය කරන විට සතර ඍද්ධිපාද සම්පූර්ණත්වයට පත් වේ. එනම්

1. ඡන්ද (දහම් මග ගමන් කිරීමට ඇති බලවත් කැමැත්ත)
2. චිත්ත (දහම්මග හැසිරීමට සිත යෙදවීම)
3. විරිය (දහම්මග උත්සාහයෙන් ඉදිරියට ගමන්කිරීම)
4. වීමංසා (දහම්මග නිවැරදිව ඉදිරියට යාමට ඇති විමසුම් නුවණ)

## සතර සම්‍යග්ප්‍රධාන වීර්ය

ඉන්පසු සතර සම්‍යග් ප්‍රධාන වීර්ය ක්‍රමයෙන් පරිපූර්ණත්වයට පත්වේ. එනම්

1. නූපන් අකුසල් නොඉපදවීමට ඇති වීර්යය
2. උපන් අකුසල් දුරුකරලීමට ඇති වීර්යය
3. නූපන් කුසල් ඉපදවීමට ඇති වීර්යය
4. උපන් කුසල් දියුණු කරලීමට ඇති වීර්යය

## පංච ඉන්ද්‍රිය ධර්ම

මෙලෙස සතර සම්‍යග් ප්‍රධාන වීර්ය සපුරන විට ශ්‍රද්ධාදි ගුණාංග ඉන්ද්‍රිය ධර්ම වශයෙන් ආධ්‍යාත්මික ජීවිතය තුළ වර්ධනය වේ. ඉන්ද්‍රිය ධර්ම පහකි. එනම්

1. සද්ධා ඉන්ද්‍රිය
2. විරිය ඉන්ද්‍රිය
3. සති ඉන්ද්‍රිය
4. සමාධි ඉන්ද්‍රිය
5. පඤ්ඤා ඉන්ද්‍රිය

## පංච බල ධර්ම

තවදුරටත් සතර සතිපට්ඨානය තුළ හික්මීමේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රද්ධාදි ගුණාංග බල ධර්ම වශයෙන් දියුණු වේ. එබඳු බල ධර්ම පහකි.

1. සද්ධා බල
2. විරිය බල
3. සති බල
4. සමාධි බල
5. පඤ්ඤා බල

## සත්ත බොජ්ඣංග

ඒ සමග සත්ත බොජ්ඣංග පරිපූර්ණත්වයට පත් වේ. එනම්

1. සති සම්බොජ්ඣංග
2. ධම්මවිචය සම්බොජ්ඣංග
3. විරිය සම්බොජ්ඣංග
4. පීති සම්බොජ්ඣංග
5. පස්සද්ධි සම්බොජ්ඣංග
6. සමාධි සම්බොජ්ඣංග
7. උපෙක්ඛා සම්බොජ්ඣංග

යන අංග හතයි. නිර්වාණාවබෝධයේ අංග වශයෙන් දක්වෙන මෙම කරුණු හත වර්ධනය වන්නේ සතර සතිපට්ඨානය නමැති භූමිය තුළයි.

## ආර්ය අෂ්ටාංගික මාර්ගය

සතර සතිපට්ඨානයෙහි අඛණ්ඩව නියැළීමෙහි ප්‍රතිඵල වශයෙන් මනාදක්ම ආදි ගුණාංග මාර්ගාංග වශයෙන් සංවර්ධනය වේ. සේඛ ප්‍රතිපදව තුළ අංග අටකින් යුතු ආර්ය මාර්ගය දියුණු වන්නේ මේ අයුරිනි. එම අංග අට නම්

1. සම්මාදිට්ඨි
2. සම්මාසංකප්ප
3. සම්මාවාචා
4. සම්මාකම්මන්ත
5. සම්මාආජීව
6. සම්මාවායාම
7. සම්මාසති
8. සම්මාසමාධි

එහි අවසාන ප්‍රතිඵලය විද්‍යාව හා විමුක්තිය සාක්ෂාත් වීම නම් වූ සසර දුකින් සපුරා නිදහස්වීමයි. එනම් අසේඛ හෙවත් අර්හත්වයට පත්වීමයි. එවිට ඉහත සඳහන් අංග අටකින් යුතු සේඛ ප්‍රතිපදාවට (*අට්ඨංගසමන්නාගතො සේඛො*) තවත් අංග දෙකක් එක් වීම් වශයෙන් අංග දහයකින් යුක්ත (*දසංගසමන්නාගතො අරහා* - මහාචත්තාරීසක සූත්‍රය, ම.නි.3) ලෝකෝත්තර භූමිය සාක්ෂාත් කරනු ඇත. සසර අනාදිමත් කාලයක් තිස්සේ විඳි නිරය ආදි අපමණ දුක් රැසින් නිදහස් ව මහා බරක් බිමින් තැබීමේ මානසික සතුට භුක්තිවිඳීමේ අවස්ථාව මෙමගින් සැලසේ. මෙහිලා විශේෂයෙන් ධර්ම මාර්ගය ආරම්භයේ පටන් ම රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංචුපාදානස්කන්ධයේ සමුදය වැය පිළිබඳ මනා වැටහීමෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වේ. ඒ අතර බුද්ධානුස්සති, මෛත්‍රී, අසුභ, මරණසති යන චතුරක්ඛා භාවනා ක්‍රම ප්‍රගුණ කොට ඇති පමණට ආනාපානසති භාවනාව වඩාත් පහසු කෙරේ. තවද ආනාපානසති භාවනාව ආරම්භයේ දී ම සති නිමිත්ත මැනැවින් හඳුනාගෙන නාසයේ අග හෝ උඩුතොල ආසන්නයෙහි සිහිය රඳවා ගැනීමට මනස හුරු කර ගැනීම භාවනාවේ සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් වේ.

මෙවැනි අතිදුර්ලභ බුද්ධෝත්පාද සමයක උපත ලද භාග්‍යසම්පන්න බුද්ධිමත් මනුෂ්‍ය රත්නයකගේ උසස් ම ජීවිත අභිලාශය විය යුත්තේ මෙම උත්තරීතර මානසික සුවය ලැබීම සඳහා වූ වැඩපිළිවෙළ සම්පූර්ණ කර ගැනීමයි. ඒ සඳහා හැකිතාක් කල්‍යාණමිත්‍ර සම්පත්තිය ලබමින් පටිච්චසමුප්පාද සංඛ්‍යාත ධර්මය ශ්‍රවණය කරමින් ඇසූ දහම ඔස්සේ යෝනිසෝ මනසිකාරයෙහි යෙදෙමින් අප්‍රමාදීව, අඛණ්ඩව, වීර්යයෙන් හා සතුටින් සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාව සම්පූර්ණ කොට විමුක්ති, විමුක්තිඤාණ සාක්ෂාත් කර ගැනීම අවශ්‍ය කෙරේ.

ඔබ සැමට තෙරුවන් සරණයි !

එක්සත් ජනපදයේ කොවිනාහි ලොස් ඇන්ජලීස් බෞද්ධ විහාරස්ථානයේ

**දසදින සූත්‍රධර්ම විවරණ වැඩසටහන 07 වන දේශනය**

(2020 දෙසැම්බර මස 18 වන සිකුරාද) (UD)

# *Vibhanga Sutta* - Mindfulness
# The Only Path to Liberation

(Samyutta Nikāya, Satipatthāna Samyutta, 326p)

All Buddhist doctrines that the Buddha has explained in his 45 years of his life focus on how to achieve happiness. In the same way the Buddha explained the path of getting rid of suffering. The main purpose of all beings is to be happy. Although they do everything in the name of happiness, unfortunately, they mostly live unhappily, or their hopes end with sorrow. The main reason for this situation is though we do everything to overcome illness, death and separation, those things themselves cause us to create suffering again and again. Here, the supreme Buddha always preaches us how to overcome suffering truly and live with real happiness. If we can listen to his message and practice it in our lives, we can get rid of suffering and achieve real happiness in this life itself. Mindfulness which is praised and recommended many times in Buddhism is one of the most important doctrines that we should practice for liberation. Especially, Vibhanga Sutta in Samyutta Nikāya describes mindfulness in three stages which are very important to know by everyone who likes to practice mindfulness in proper way to achieve liberation.

Buddhism explains the reasons we suffer. Birth is suffering. Decay is suffering. Sickness is suffering. Death is suffering… Finally, Buddhism concludes all sufferings in five aggregates. In short, arising of the five aggregates is suffering (Samkhittena pañcupādānakkhandā dukkhā). The path of getting rid of suffering depends on understanding and releasing the grasping of the five aggregates. Practicing mindfulness is the path that leads to the liberation from the suffering of the five aggregates.

Mindfulness guides us how to live in the present moment. When we spend our life, we mostly live in the past or future. Unfortunately, we don't know that we live in the past or future because of ignorance and lack of mindfulness. We have lost the chance of seeing the beauty of the present experience. By practicing mindfulness, we train our mind not to go to the past or future without awareness, but to live in the present moment seeing the world reality. Our success or happiness and how far we have overcome suffering depend on how much we have practiced mindfulness. By practicing mindfulness, we train our mind to be aware of our mind and body. Mindfulness is the best friend who brings the real happiness. Mind with mindfulness is the best friend. Similarly, mind without mindfulness is the worst enemy. We should be clever enough to live with the best friend getting rid of the worst enemy.

The importance of practicing mindfulness is always emphasized among Buddhist doctrines. Mindfulness is the seventh factor of the Noble Eightfold Path; it is the third faculty (or indriya) of The Five Spiritual Faculties; and it is also the first faculty of The Seven Enlightenment Faculties. Therefore, we can understand how important it is in Buddhism. Mindfulness in Buddhism relates to wisdom which is the understanding of impermanence.

All Buddhist teachings can be included into one topic that is mindfulness. Our spiritual success and real happiness depend on how far we have practiced mindfulness in our lives. Practicing Buddhism means practicing mental culture. Practicing mental culture means practicing mindfulness. Also, practicing mindfulness means practicing happiness. Finally, we can say very clearly practicing of all teachings of the Buddha means practicing mindfulness. The entire dispensation of the Buddha depends on practicing mindfulness. Hence mindfulness is highly praised in Buddhism.

That is why Buddhism illustrates the one and only way;

for the purification of beings (*Sattānam visuddhiyā*),
for the overcoming of sorrow and lamentation (*sokapariddavānam samatikkhamāya*),
for the destruction of pain and grief (*dukkhadomanassanam attamgamaya*),
for the gaining of wisdom (*ñāyassa adhigamāya*)
for the attaining or realization of Nibbana or enlightenment (*nibbānassa acchikiriyāya*)
which is practicing the fourfold mindfulness.

## *Satipaṭṭhāna, Satipaṭṭhāna Bhāvanā and Satipaṭṭhānabhāvanāgāmini patipadā*
## Mindfulness, Mindful Meditation and the path of Mindful Meditation

When we discuss mindfulness, we can see that a lot of people discuss it everywhere in the current society. Mostly they say mindfulness is that living in the present moment. Actually, this is not an exact definition for mindfulness according to Buddhism. Mindfulness is not just living in the present moment. Mindfulness, which leads to overcome all sufferings completely, has a wide meaning in Buddhism. According to Vibhanga Sutta in Satipaṭṭhāna Sanyutta of Samyutta Nikāya, he who wants to know and practice mindfulness should know three things about mindfulness.

*"Satipaṭṭhānañca vo, bhikkhave, desessāmi satipaṭṭhānabhāvanañca satipaṭṭhānabhāvanāgāminiñca paṭipadaṃ "*

They are Mindfulness, mindful meditation and the path of mindful meditation. Mindfulness means keeping our attention in four areas as body, feelings, consciousness and mental formations. Mindful meditation means reflecting on the impermanence of the body, feelings, consciousness and mental formations as arising and ceasing (*Katamā ca, bhikkhave, satipaṭṭhānabhāvanā? Idha, bhikkhave, bhikkhu samudayadhammānupassī kāyasmiṃ viharati, vayadhammānupassī kāyasmiṃ viharati, samudayavayadhammānupassī kāyasmiṃ viharati*,...). The path to mindful meditation means (*Katamā ca, bhikkhave, satipaṭṭhānabhāvanāgāminī paṭipadā? Ayameva ariyo aṭṭhaṅgiko maggo*....) understanding the noble eightfold path which consists with the four noble truths. The Noble Eightfold Path is,

Right Understanding (*Sammā diṭṭhi*)
Right Thoughts (*Sammā samkappa*)
Right Speech (*Sammā vācā*)
Right Action (*Sammā kammantha*)
Right Livelihood (*Sammā ājiva*)
Right Effort (*Sammā vāyāma*)
Right Mindfulness (*Sammā sathi*)
Right Concentration (*Sammā samādhi*)

Understanding mindfulness in Buddhism depends on understanding the dependent origination which is described below.

The Satipatthāna Sutta deals with the fourfold development of 'Sati', mindfulness and 'Patthāna', establishment or practice. So 'Satipatthāna' means establishment of mindfulness. The main purpose of practicing mindfulness is to investigate what happens to our mind and body and finally understanding whole life. If we can clearly understand the process of our life as it is, we can overcome all sufferings that we worry in our day to day life and in whole sansāric journey.

Here it is said the four types of areas where we practice mindfulness. They are;

- The Contemplation (or mindfulness) of the body (*Kāyānupassanā*)
- The Contemplation (or mindfulness) of sensation or feelings (Vedanānupassanā)
- The Contemplation (or mindfulness) of mind (*Cittānupassanā*)
- The Contemplation (or mindfulness) of mind-objects (*Dhammānupassanā*)

According to practicing mindfulness in these four areas, we develop our attention and awareness about our body and mind. And we practice our attention to live in the present moment consciously. We mostly suffer because of the past or the future. If we lose our attention with mindfulness about the present, it means we lose our happiness. That is why Buddhism emphasizes here the importance of developing mindfulness.

## • The Contemplation of Body

When we practice mindfulness in the field of body, we develop it in six areas.

They are;

- Mindfulness of breathing (*Ānāpāna*).

When someone breathes, he does it consciously.

- Mindfulness of the four postures (*Iriyāpatha*)

When someone is walking, he knows he is walking. When someone is standing, he knows he is standing. When someone is sitting, he knows, he is sitting. When someone is lying down, he knows he is lying down.

- Mindfulness of clear awareness (*Sampajañña*)

When someone does everything from waking up to going to bed, he does all of them mindfully and wisely.

- Mindfulness or reflection on the repulsive: Parts of the body (*Patikkulamanasikāra*)

Here, meditator considers his all (32) parts of body such as hair, nail, teeth, skin are impure.

- Mindfulness of the four elements (*Dhātumanasikāra*)

Here, meditator further pays attention to four elements like earth (*Patavi*), water (*Āpo*), fire (*Tejo*) and air (*Vāyo*).

- Mindfulness of the Nine Charnel- Ground (*Navasīvatika*)

Here, meditator recollects a dead body, what happens to the body after death (from moment of death to a skeleton). While he is investigating his whole body according to above areas, he sees arising and ceasing of the body.

## • The Contemplation of Feelings (or sensation)

Here, someone feeling a pleasant feeling knows that he feels a pleasant feeling, feeling a painful feeling he knows that he feels a painful feeling, feeling a feeling that is neither painful nor pleasant he knows that he feels a feeling that is neither painful nor pleasant.

While he is investigating his whole feelings according to above information, he sees arising and ceasing of all feelings.

## • The Contemplation of Mind

Here, the meditator considers his own mind whether it is lustful or not, hating or not, deluded or undeluded, contracted or distracted, developed or undeveloped, surpassed or unsurpassed, concentrated or unconcentrated, liberated or unliberated.

While he is investigating his mind process according to above areas, he sees arising and ceasing of mind.

## • The Contemplation of Mind-objects

• The five hindrances (sensual desire, ill will, sloth and torpor, restlessness and scruples, skeptical doubt)

• The five aggregates (form, feeling, perception, metal formation, consciousness)

• The six internal and external sense bases (eye, ear, nose, tongue, body, mind – sight, sound, smell, taste, touching, mind-objects)

• The seven factors of enlightenment (Mindfulness, Keen investigation, Energy, Rapture, Tranquility, Concentration, Equanimity)

• The Four Noble Truths

1. The unsatisfactoriness (*Dukkha Sacca*),
2. The cause of unsatisfactoriness (*Samudaya Sacca*),
3. The cessation of unsatisfactoriness (*Nirodha Sacca*),
4. The path that leads to cessation of unsatisfactoriness (*Magga Sacca*)

While he is investigating his whole mind objects according to above areas as unwholesome and wholesome, he reflects arising and ceasing of his mind objects.

As the result of practicing mindfulness by using Buddhist teachings, we don't stop concentrating mind. With concentrated mind, we reflect on the world reality as impermanent seeing arising and ceasing of our mind and body. Here it is very important to understand the dependent origination. Our entire life is the five aggregates which arise at the moment with conditions and cease when conditions cease.

If we have any experience through our six senses, five aggregates arise together at the moment. Five aggregates are forms (*Rupa*-රූප), feelings (*Vedanā*-වේදනා), perception (*Saññā*-සඤ්ඤා), mental formations (*Samkhāra*-සංඛාර) and mind (*Viññāna*-විඤ්ඤාණ). These five aggregates arise together at the moment when the conditions are together, and they instantly cease when the conditions separate. These five things appear behind any kind of experiences in our life, but they are invisible, and have to be known with insight. The nature of these five aggregates is arising and ceasing. At the moment of ceasing everything ceases without leaving anything remaining. The most valuable and interesting explanation in Buddhism is impermanence. It is said in Buddhism; **Not being occurred (in the past) comes to an occurrence. Being occurred (at the present) will not come to (the future) occurrence** (*Ahutvā sambhutam hutvā na bhavissati*). This is the nature of impermanence that Buddhism illustrates. If something is impermanent (*Anicca*), it is suffering (*Dukkha*). If something is suffering, it is out of our control (*Anatta*). If someone can realize these three characteristics as the worldly reality, he is able to overcome suffering.

When we see this reality, we understand, there is nothing to grasp or reject. We comprehend our life as a conditioned process. There is no particular certain being or person, it is only a process which always arises and ceases. With this true understanding we can gradually overcome suffering. Little by little we go forward on the path of liberation from suffering and unsatisfactoriness. By practicing tranquility (*Samatha*) and insight (*Vipassanā*) meditation with discipline (*Sīla*) in speech and behavior, we reach the final bliss of liberation, full enlightenment. Here it is clear that mindfulness is the foundation of all doctrines. Living in mindfulness is like living in the field of the Buddha. It means we are away from suffering like decay, death and rebirth. Whenever we are away from mindfulness, then we are in the field of the Mara. It means we are not away from suffering like sorrow, lamentation, grief, pain, decay, sickness, death and rebirth.

As the result of practicing mindfulness, the five spiritual faculties are going to be filled. They are confidence, energy, mindfulness, concentration and wisdom.

The Supreme Buddha often encourages us to make a refuge that none can disturb our peace of mind. Here the Buddha kindly emphasizes the path to make a refuge as practicing mindfulness. Living in mindfulness is like living in the field of the Buddha. Practicing mindfulness is also to make an unshakable mind that none can disturb the peace of mind.